

# අඤ්ඤාකොණ්ඩඤ්ඤ සූත්‍රය

# අඤ්ඤාකොණ්ඩඤ්ඤ සූත්‍රය.

පාලාගම විවේකාරාම වාසී උගත්

මාලඹුල්ලේ

## විමලරතන

## ස්වාමින්වහන්සේ විසින්

ලියන ලද

පෙළ අටුවා සඳහන් විස්තර භාවාර්ථ සන්න සහිතයි.


මහ අරුග්ගොඩ

වෛද්‍යක ඩී. ඒ. විජේසූරිය මහතා විසින්

මොල්ලිගොඩ

ලංකාවිශ්‍රැත යන්ත්‍රාලයෙහි

මුද්‍රණය කරවන ලදී.

ශ්‍රී බු. ව. 2458.

ශ. ව. 1837.

Printed at the Lanka Vissruta Press

Molligoda.

# විඥප්තිය

——:(o:——

ත්‍රිභුවන භව වන්දනීයවූ අප තිලෝගුරු සම්මා සම්බුද්ධ රජාණන් වහන්සේ මහ කුළුණු නුවනින් යෙදී ශ්‍රී සද්ධර්ම නැමති අමා මෑණී, භව්‍ය සත්ත්වයන්ගේ කෙලෙස් ගිණි නිවා නිවන් සිරි සුව දිදී රජගහ නුවර වේළුවන මහ වෙහෙර වැඩ වසන සමයෙහි සියළු තථාගත ශ්‍රාවකයන් වහන්සේලාට පළමුව චතුස්සත්‍යාවබෝධයෙන් නිවන් දත් හෙයින් අඤ්ඤාකොණ්ඩඤ්ඤ නම් ලත් විශිෂ්ට භාවෝපලක්ෂිත ස්ථිරාග්‍රව මහ රහතන් වහන්සේ අරහයා දේශනාකර වදාළ මේ අඤ්ඤාකොණ්ඩඤ්ඤ සූත්‍රාන්ත ධර්මදේශනාව සඞ්ගීතිකාරක මහ රහතන් වහන්සේලා විසින් සත් දහස් සත්සිය දෙසැටක් සූත්‍රදේශනා ප්‍රතිමණ්ඩිත සංයුත්ත නිකායෙහි වඞ්ගීස සංයුත්තකාන්තර්ගත නවවැනි සූත්‍රය මෙන් සඞ්ගායනා කර වදාරණ ලදි, ඒ මේ සූත්‍ර දේශනාව පිළිබඳ මධුර සාරාර්ථයන් සුඛාවබෝධය පිණිස මීට පෙර පදාර්ථ සන්න්‍යාදියක් නොතිබුන බැවින් සද්ධර්මාභිලාෂානුකම්පා වෙන් ශාලානාම විශ්වකාරාම වාසී ගෞරවාර්හ අරූපෙගොඩ සාරලංකාර ස්වාමිපාදයන් වහන්සේගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යවූ මාලඹුල්ලේ විමලරතන ස්වාමීන්වහන්සේම කතිපය වාරයක්ම ආරාධනා කොට පෙළ අටුවා පදාර්ථ භාවාර්ථ සන්න යන මෙයින් සමුපලක්ෂිතවූ මෙය සම්පාදනය කරවා ගන්නා ලදින් මෙසේ මුද්‍රණය කරවිමු.

තවද ධර්මදේශකයන් වහන්සේලාට මහෝපකාරී වන පරිදි දේශනාර්ථ සාර පදාර්ථ සන්න යන මෙයින් යුක්තවූවා පමණකුත් නොව ගෘහස්ථ පක්ෂයාට ද ධර්මාවබෝධයට අත්‍යන්තෝපකාරී අඤ්ඤාකොණ්ඩඤ්ඤ ස්ථවිර චරිතය ආශ්චර්යවත් තත්පරිනිර්වාණය වඞ්ගීස චරිතය යනාදී මධුර ධර්මාන්තර්ගතව සම්පූර්ණ සූත්‍ර සටි ලියන ලද විස්තර භාව සන්නයකින්ද සමුපලක්ෂිත බැවින් ගිහි පැවිදි උභය පක්ෂයටම මෙය අත්‍යන්තෝපකාරී වේමය.

එබැවින් පුණ්‍යාර්ථීන් විසින් මෙය ශ්‍රවණ උද්ග්‍රහණ ධාරණාදිය කිරීමෙන් මතු ස්වර්ග මෝක්ෂ සම්පත්ති ප්‍රතිලාභයට උත්සාහ කටයුතු.

මෙහි අක්ෂර යෝජකයින්ගේ ප්‍රමාදයෙන් සමහර තැනක බැඳි අකුරු වෙනුවට අල් අකුරු යෙදී තිබේ. එහින් ධර්මාවබෝධයට කිසි පාඩුවක් නොවෑහිසි පෘථජ්ජන කාටත් වරදින සුළු බැවින් සන්දේහ ස්ථානයක් ඇතහොත් එය ශාසනාලයෙන් සමාධිසීලි ප්‍රාඥ පඬිවරුන් වෙත එළඹ විචාළ යුතු.

මෙය නැවත මුද්‍රණය කරවීමේ අයිතිය මෙහි පහත අත්සන් කරණ මවෙතම තබාගත්තෙමු.

# අඤ්ඤාකොණ්ඩඤ්ඤ සුත්තං

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

ඒවං මෙ සුතං එකං සමයං භගවා රාජගහෙ විහරති වේළුවනෙ කලන්දකනිවාපෙ අථ ඛො ආයස්මා අඤ්ඤාකොණ්ඩඤ්ඤෝ සුචිරස්සෙව යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවතො පාදානි මුඛෙන ච පරිචුම්බති පාණීහි ච පරිසම්බාහති නාමඤ්ච සාවෙති කොණ්ඩඤ්ඤාහං භගවා කොණ්ඩඤ්ඤාහං සුගතාති.

අථ ඛො ආයස්මතො වඞ්ගීසස්ස එතදහොසි අයං ඛො ආයස්මා අඤ්ඤාකොණ්ඩඤ්ඤෝ සුචිරස්සෙව යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවතො පාදානි මුඛෙන ච පරිචුම්බති පාණීහි ච පරිසම්බාහති නාමඤ්ච සාවෙති කොණ්ඩඤ්ඤාහං භගවා කොණ්ඩඤ්ඤාහං සුගතාති යන්නූනාහං ආයස්මන්තං අඤ්ඤාකොණ්ඩඤ්ඤං භගවතො සම්මුඛා සාරුප්පාහි ගාථාහි අභිත්ථවෙය්‍යන්ති අථ ඛො ආයස්මා වඞ්ගීසො උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිම්පණාමෙත්වා භගවන්තං එතදවොච පටිභාති මං භගවා පටිභාති මං සුගතාති. පටිභාතු තං වඞ්ගීසාති භගවා අවොච අථ ඛො ආයස්මා වඞ්ගීසො ආයස්මන්තං අඤ්ඤාකොණ්ඩඤ්ඤං භගවතො සම්මුඛා සාරුප්පාහි ගාථාහි අභිත්ථවි.

1 බුද්ධානුබුද්ධො සො ථෙරො කොණ්ඩඤ්ඤො තිබ්බනික්කමො
ලාභී සුඛවිහාරානං විවෙකානං අභිණ්හසො

2 යං සාවකෙන පත්තබ්බං සත්ථුසාසනකාරිනා
සබ්බස්ස තං අනුප්පත්තං අප්පමත්තස්ස සික්ඛතො

3 මහානුභාවො තෙවිජ්ජො චෙතොපරියායකොවිදො
කොණ්ඩඤ්ඤො බුද්ධදායාදො පාදෙ වන්දති සත්ථුනො, ති.

නිට්ඨිතං.

## අඤ්ඤාකොණ්ඩඤ්ඤ සූත්‍ර විවරණය.

අඤ්ඤාකොණ්ඩඤ්ඤොති. පඨමං ධම්මස්ස අඤ්ඤාතත්තා එවං ලද්ධ නාමො ථෙරො සුචිරං ... කිව චිරායං ... සංවච්ඡරානං එත්තකං කාලං කත්ථ විහාසීති, ඡද්දන්තවනෙ මන්දාකිනීපොක්ඛරණියා තීරෙ පච්චෙකබුද්ධානං වසනට්ඨානෙ වසමා? විහාරගරුකො ය, සො හි පඤ්ඤවා ... එව භගවතා එවරූපො දසසහස්සචක්කවාළෙ දෙවමනුස්සානං මජ්ඣෙ ගුණා පකාසිතො?, දෙවමනුස්සා පරිසමජ්ඣෙ ... ගන්ධමාලාදීහි පූජං කත්වා අග්ගධම්මං පටිවිද්ධසාවකො ති අනන්තරං ථෙරං උපසඞ්කමිත්වා පූජෙත්ති, සත්ථාරං ආගන්තුකන්ව නාම තථාරූපධම්මකථා වා පටිසන්ථාරො වා කාතබ්බො, කොත් ථෙරො වි විහාරගරුකො සෙනාසන සො පගෙසුවා විය උපට්ඨාති ඉති විහාරගරුතාය තත්ථ ගන්ත්වා විහාසි අපරම්පි කාරණං භික්ඛාචාරවෙලායං තාව සබ්බසාවකා වසනට්ඨාන ගච්ඡන්ති, ධම්මදෙසනා කාලෙ පන ... අලඞ්කත බුද්ධාසනස්ස උත්තරි නිසින්නො දක්ඛිණහත්ථපස්සෙ ධම්මසෙනාපති වාමහත්ථපස්සෙ මහා මොග්ගල්ලානත්ථෙරො නිසීදති, තෙසං වීථිභාගෙ අඤ්ඤාකොණ්ඩඤ්ඤ ථෙරස්ස ආසනං පඤ්ඤපෙන්ති සෙසභික්ඛූ තං පරිවාරෙත්වා නිසීදන්ති, එව අග්ගසාවකා අග්ගධම්මං පටිවිද්ධන්තාව ... ථෙර ... ථෙරං ... විය අග්ගික්ඛන්ධං විය ආසිවිසං වියව ... ධුරාසනෙ නිසීදන්තා ඔත්තප්පන්ති ... ථෙරො චින්තෙසි ඉමෙහි ධුරාසනෙ ... කප්පසතසහස්සාධිකං අසඞ්ඛෙය්‍යං පාරමියො පූරිතා එත ඉදානි ධුරාසනෙ නිසීදන්තා මම ඔත්තප්පන්ති ... ඵාසුවිහාරං ... කාරිස්සාමීති. සො පතිරූපෙ කාලෙ තථාගතං උපසඞ්කමිත්වා ඉච්ඡාමහං භන්තෙ ජනපදෙ වසිතුන්ති ආහ සත්ථා අනුජානි, ථෙරො සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරමාදාය ඡද්දන්තවනෙ මන්දාකිනීතීරං ගතො පුබ්බෙ පච්චෙකබුද්ධානං පාරිචරියාය කතපරිචයා අට්ඨනාගසහස්සිනාගා ථෙරං දිස්වාව මහාකං පුඤ්ඤක්ඛෙත්තං ආගතන්ති නඛෙහි වඞ්කමනං නිත්තිණං කත්වා ආවරණසාඛා හරිත්වා ථෙරස්ස වසනට්ඨානං පටිජග්ගිත්වා, චිත්තං කත්වා සබ්බෙ සන්නිපතිත්වා මන්තයිංසු, සචෙහි මයං අයං ථෙරස්ස කත්තබ්බං කරිස්සති අයං කරිස්සතීති පටිපජ්ජිස්සාම ථෙරො බහුඤ්ඤිකං ගාමං ... විය ... වාරෙන තං පටිජග්ගිස්සාම එකෙකස්ස පන වාරෙ ... වාරං අකංසු, ... ථෙරස්ස ... දන්තා

කමණ්ඩලු සපෙරි මිත්තං කරෙති— මන්දාකිනියො, තීරම්හි තාව එකඞ්ගුලගම්භීරා හොති, තතො පට්ඨාය යොජනමත්තෙ ඨානෙ සෙවාලො වා පණකං වා නත්ථි ඵලිකවණ්ණං උදකමෙව හොති, තතො පරං පන කටිප්පමාණෙ උදකෙ අඩ්ඪයොජනවිත්ථතං සෙතපදුමවනං. පණ්ණාසයොජනං සරං පරික්ඛිපිත්වා ඨිතං තදනන්තරං තාව මහන්තම්බරත්තපදුමවනං තදනන්තරං සෙතකුමුදවනං, තදනන්තරං රත්තකුමුදවනං, තදනන්තරං නීලුප්පලවනං, තදනන්තරං රත්තුප්පලවනං තදනන්තරං සුගන්ධරත්තසාලිවනං තදනන්තරං එලාළුකලාබුකුම්භණ්ඩාදීනි මධුරසානි වල්ලිඵලානි, තදනන්තරං අඩ්ඪයොජනවිත්ථාරමෙව උච්ඡුවනං. තත්ථ පූගරුක්ඛක්ඛන්ධප්පමාණා උච්ඡු තදනන්තරං කදලිවනං යතො ද්වෙ පක්කානි ඛාදන්තා කිලමන්ති, තදනන්තරං චාටිප්පමාණඵලං පනසවනං, තදනන්තරං අම්බවනං තදනන්තරං ජම්බුවනං, තදනන්තරං කපිත්ථවනන්ති, සඞ්ඛෙපතො තස්මිං දහෙ ඛාදිතබ්බයුත්තකං ඵලං නාම නත්ථීති නවත්තබ්බං, කුසුමානං පුප්ඵසමයෙ වාතො රෙණුවට්ටිං උට්ඨාපෙත්වා පදුමිනිපණ්ණෙසු ඨපෙති තත්ථ උදකඵුසිතානි පතන්ති, තතො ආදිච්චපාකෙන පච්චිත්වා පක්කඅයොඝටිකාමධු තිට්ඨන්ති එතං පොක්ඛරමධු නාම තං ථෙරස්ස ආහරිත්වා දෙන්ති මූළාලං නඞ්ගලසීසමත්තං හොති තම්පි ආහරිත්වා දෙන්ති. භිසං මහාභෙරිපොක්ඛරප්පමාණං හොති, තස්ස එකෙකස්මිං පබ්බෙ ඝටප්පමාණං ඛීරං හොති තං ආහරිත්වා දෙන්ති, පොක්ඛරට්ඨිනි මධුරසක්ඛරස යොජෙත්වා දෙන්ති, උච්ඡුං පාසාණපිට්ඨෙ ඨපෙත්වා පාදෙන අක්කමන්ති තතො රසො පග්ඝරිත්වා සොණ්ඩිආවාටෙ පූරෙත්වා ආදිච්චපාකෙන පච්චිත්වා ඛීරපාසාණපිණ්ඩො විය තිට්ඨති තං ආහරිත්වා දෙන්ති පනසකදලිඅම්බපක්කාදීසු කථාව නත්ථි කොලාහලපබ්බතෙ නාගදත්තො නාම දෙවපුත්තො වසති ථෙරො තාලෙත කාලං තස්ස විමානද්වාරං ගච්ඡති, සො නවසප්පිපොක්ඛරමධුමූලසංයුත්තස්ස ඛීරොදකපායාසස්ස පත්තං පූරෙත්වා දෙති සො කස්සපබුද්ධකාලෙ වීසති වස්සසහස්සානි සුගන්ධසප්පිනා ඛීරසලාකං අදාසි තෙනස්සෙතං භොජනං උප්පජ්ජති. එවං ථෙරො චාදසවස්සානි වසිත්වා අනන්තතො ආයුසංඛාරං ඔලොකෙන්තො පරික්ඛීණභාවං ඤත්වා තත්ථ පරිනිබ්බායිස්සාමීති චින්තෙත්වා සත්ථිනාගෙහි මං මාදසවස්සානි උපට්ඨහන්තෙනාපි දුක්කරං කතං තස්මා අනුජානාපෙත්වා එතෙසං ඉධෙව සන්තිකෙ පරිනිබ්බායිස්සාමීති ආකාසෙන ආගච්ඡන්තො සත්ථිකං අගමාසි තෙන වුත්තං සුචිරස්සෙව යෙන භගවා තෙනුපසඞ්කමී,ති නාමඤ්ඤාති, කස්මා නාමං සාවෙති ථෙරං ති

කෙචි සඤ්ජානන්ති කෙචි න සඤ්ජානන්ති තත්ථ ථෙර මිගෙනපි සෙඛං අජානන්තා සො එව ... සීසො ඔභාසො ... පාතුරහොසි නො මහල්ලකො සත්ථාර සදිසං පටිභානවන්තං කරෙයිසි ති චිත්තං පදුමුත්තරස්ස අපායපුරා භවිස්සන්ති යෙපනඤ්ඤං ජානන්තා දස සහස්ස චක්කවාළෙ සත්ථා විය පඤ්ඤවතො නාකමෙවා මහා නාව කොති චිත්තං පසාදෙන්ති තෙ සග්ගපරා භවිස්සන්ති,ති සත්තානං අපායභයං පිදහිත්වා සග්ගමග්ගං විවරන්තො නාමං සාවෙති බුද්ධානුබුද්ධොති, සත්ථාපදානං චත්තාරි සච්චානි බුජ්ඣි. පච්ඡා ථෙරො තස්මා බුද්ධානුබුද්ධොති වුච්චති, නිබ්බත්තිකාලෙති, බහුලවිරියො, වීරමකාන්තනා, තිනනං විදෙනානං ... වෙදනා සමිගාය කොවිදො, ජප්පු පුනිවස්සසු වතංසසා විදතී, ඉතර වෙ කිඤ්චාපි නවුත්තා ථෙර පන ජලහිඤ් ඤව, ඉමිස්සා ච කාරාය පරියොසානෙ පරිසා ...සිද්දි පරියාය තත් තිස්සනතහාතං ඤත්වා ථෙරො සත්ථාර අභිං සවිනන්වාථං කත්වා පරික්ඛිපනා මෙ භන්තෙ ආයුසඞ්ඛාරා පරිනිබ්බායිස්සාමිති පරිනිබ් බානකාලං අනුජානාපෙසි සත්ථා පරිනිබ්බායිස්සසි කොණ්ඩඤ්ඤාති උපවීථ්ථාකෙති මෙ භන්තෙ ශන්පිනාගෙයි දුක්ඛරංකතං නොතං සන්තිකෙති, සත්ථා අනුජානි, ථෙරො දසබලං පදක්ඛිණං කත්වා තං මෙ භන්තෙ පඨම දස්සනං ඉදං පච්ඡිමදස්සනන්ති පටිජානිත්ථේන මහාජනෙ සත්ථාරං වන්දිත්වා නික්ඛමිත්වා මාරංනොවිඨ්ඨකා සීනො මා සොචිත්ථ මා පරිදෙවිත්ථ බුද්ධා වා හොන්තු බුද්ධසාවකා වා උප්පන්නාසඞ්ඛාර අසීඝනකා නාම නත්ථීති මහාජනං ඔවි දිත්වා පස්සන්තස්සෙව මහාජනස්ස වෙහාසං අබ්භුග්ගන්ත්වා ඡද්දන් තිතීරෙ ඔතරිත්වා පොක්ඛරණියං නහායිත්වා, නිවත්ථනිවාසනො කතුත්තරාසඞ්ගො සොපානසන්තං සංඝාටිං ඔත්ථරිත්වා ඵලසමාපත්තිසං තතො යාමෙ වීතිනාමෙත්වා බලවපච්චූසසමයෙ පරිනිබ්බායි. ථෙර ස්ස සහපරිනිබ්බානෙන හිමවති සබ්බරුක්ඛා පුප්ඵෙසු ච ඵලෙසු ච ඔනතවිනතා අහෙසුං, වාරිනාගා ථෙරස්ස පරිනිබ්බුතභාවං අජා නන්තා පාතොව මුඛධොවනදන්තකට්ඨානි උපට්ඨපෙත්වා චත්තං කත්වා ඛාදනීයභොජනීයං ආහරිත්වා චණ්ඩාමනකොටිං අට්ඨාසි යොව යාව සුරියුග්ගමනා ථෙරස්ස නික්ඛමනං අපස්සන්තා කිත්නුඛො එතං පුබ්බෙ අයෙයා පාතොව වඩ්ඪකවති මුඛං ධොවති අජ්ජ පන පණ්ණසාලතො පි න නික්ඛන්තීති කුටිද්වාරං විවරිත්වා ඔලොකෙන් තො ථෙරං නිසින්නකමෙව දිස්වා හත්ථං පසාරෙත්වා පරාමසිත්වා අස්සාසපස්සාසෙ පරියෙසන්තා තෙසං අප්පවත්තිභාවං ඤත්වා පරි නිබ්බුතො ථෙරොති සොණ්ඩං මුඛෙ පක්ඛිපිත්වා මහාවිරවං විරවිංසු.

සකලහිමවන්තො එකනීලොද අහොසි. අථ නාගා හත්ථිනො සන්නිපතිත්වා ථෙරං ජෙට්ඨනාගස්ස කුම්භෙන නිසීදාපෙත්වා පුප්ඵිතං ගහෙත්වා පරිවාරෙත්වා සකලහිමවන්තං අනුවිචරිත්වා සන්නිපාතෙත්වා ආනයා — සක්කො විස්සකම්මං ආමන්තෙසි තාත අම්හාකං ජෙට්ඨභාතා පරිනිබ්බුතො සක්කාරං කරිස්සාම නවයොජනිකං සබ්බරතනමයං කූටාගාරං මාපෙහීති, සො තථා කත්වා ථෙරං තත්ථ නිපජ්ජාපෙත්වා [illegible] අදාසි, තෙ කූටාගාරං උක්ඛිපිත්වා තියොජනසහස්සං හිමවන්තං පුනප්පුනං අනුවිචරිංසු, තෙසං හත්ථතො ආකාසට්ඨකා දෙවා ගහෙත්වා සාධුකීළං කීළිංසු තතො වස්සවලාහකා සීතවලාහකා උණ්හවලාහකා වාතවලාහකා චාතුම්මහාරාජිකා තාවතිංසාති එතෙ නුපයෙන යාව බ්‍රහ්මලොකා කූටාගාරං අගමාසි, පුන බ්‍රහ්මානො තෙසං දෙවා නන්ති අනුපුබ්බෙන හත්ථිනාගානං යෙව කූටාගාරං අදංසු, එකා දෙවතා චතුරඞ්ගුලමත්තං චන්දනසාරං ආහරි, චිතකො නවයොජනිකො අහොසි, කූටාගාරං චිතකං ආරොපයිංසු, පඤ්චසතකුම්භ සහස්සානි ආකාසෙ සන්තානෙත්වා සබ්බරත්තිං සජ්ඣායමකංසු, අනුරුද්ධ ථෙරො ධම්මං කථෙසි, බහූනං දෙවතානං ධම්මාභිසමයො අහොසි, පුනදිවසෙ අරුණුග්ගමනවෙලාය චිතකං නිබ්බාපෙත්වා සුමනමකුලවණ්ණානං ධාතූනං පරිස්සාවනං පූරෙත්වා භගවතො නිස්සයිත්වා වෙළුවනවිහාරතො ඨිතකානං සමපනොත ආහරිත්වා සත්ථුනො රථෙ ඨපයිංසු; සත්ථා ධාතුපරිස්සාවනං ගහෙත්වා පඨවියා හත්ථං පසාරෙසි, මහාපඨවිං භින්දිත්වා රජතබුබ්බුලං සදිසං චෙතියං නික්ඛමි සත්ථා හත්ථං පත්තෙත්වා චෙතියෙ ධාතුයො නිදහි, අජ්ජාපි කිර තං චෙතියං ධරතියෙවාති—

—නිට්ඨිතං—

—o—

අඤ්ඤාකොණ්ඩඤ්ඤ සූත්‍රාර්ථ ව්‍යාඛ්‍යානය.

---

එවමෙමෙ සුතං එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ— මෙ, ප්‍රවර කීර්ති ඝොෂාවන්ත වූ මහා කාරුණික සර්වඥයන් වහන්සේ විසින් ප්‍රසිද්ධ බෞද්ධ ශ්‍රද්ධ ජනප්‍රමුඛ සකල ශ්‍රොතෘජන ප්‍රසාද එළවන්නාවූ මේ අඤ්ඤාකොණ්ඩඤ්ඤ සූත්‍රාන්ත ධර්මදෙශනාව මා විසින්; එවංසුතං, මේ ආදී වශයෙන් ගරන්නත් අසනලද මෙසේ අසනලද මෙසේම අසනලදි. කෙසේද යත්

මේ, මිහුපෙළෙමිනාරුදස විශාරදවූ දසබලධාරීවූ ආකාශගෝත්‍රීවූ සිංහනාද නඳිවූ සවී සහෝදර්තමවූ අසමසම වූ අනාත්මසාධාරණවූ ධර්ම ස්වරවූ ධර්මරාජ්‍යවූ ඒ තිලෝගුරු බුදුරජාණන්වහන්සේගේ ධර්ම භාණ්ඩාගාරික ශ්‍රාවකවූ මාගේ; ශ්‍රැතං, අසා ධර්මනීරුත්ති ප්‍රතිභාන සඞ්ඛ්‍යාත චතුර්විධ ප්‍රතිසම්භිදාගතවූ ඥාතිය හෙවත් මෙම සූත්‍රාගත ධර්මදේශනාව ඇසීම; එවං, මෙසේයැයි එකංසමයං, (සත්වන්තර සෘතු මාසාර්ධ මාසරාත්‍රිදිව පූර්වාහ්ණ අපරාහ්ණ ප්‍රථම යාම මධ්‍යම යාම පශ්චිම යාම ක්ෂණ මුහුර්තාදිවූ කාලප්‍රභේදයන් අතුරෙන්) එක්තරා කාලයෙක්හි (දෝයෝ නොහොත් ගර්භාවක්‍රාන්ති සමය, ජාති සමය, සංවේග සමය, අභිනිෂ්ක්‍රමණ සමය, දුෂ්කරක්‍රියා සමය, මාරවිජය සමය, සම්‍යක් සම්බෝධි සමධිගමකාල සමය, දිට්ඨ ධම්ම සුඛ විහාර සමය, දේශනාශීත පටිපත්ති සමය, පරහිත පටිපත්ති සමය, දේශනා සමය, පරිනිර්වාණ සමයයයි කියනලද සියළු දිව්‍ය මනුෂ්‍යාදීන් කෙරෙහි ප්‍රකාශිත සමයන් අතුරෙන් කරුණාකෘත්‍යමය සඞ්ඛ්‍යාතවූ එක් ධර්මදේශනා සමයෙක්හි, භගවා, සෞභාග්‍යලක්ෂණ ධරත්වාදි භාග්‍යයෙන් යුක්තවූ සම්‍යක් සම්බුද්ධ සර්වඥ රාජෝත්තමයාණන් වහන්සේ; රාජගහෙ, මහාමන්ධාතු මහෝව්ත්දදී නරෙන්ද්‍රයන් විසින් අධිෂ්ඨිතවූ හෙයින් රජගෘහනම්වූ (දෝහෝ නොහොත්) ඉසිගිලි වෙභාර වෛපුල්ල පාණ්ඩව ගිජ්ඣකූට යන පර්වත රාජයන්ගෙන් පරික්ෂිප්තවූ හෙයින් රජගෘහ නම්වූ පුරප්‍රවරයෙක්හිවූ; කලන්දකනිවාපෙ, කලන්දකයන්ට තබා දෙනලද බත් වැඩුප් ඇති හෙයින් කලන්දකනිවාප නම්වූ; වෙළුවනෙ, උණවෙනින් පරික්ෂිප්ත හෙයින් වෙළුවන නම්වූ (නොහොත්) අෂ්ටාදශ හස්තප්‍රමාණ ප්‍රාකාරයකින් හා ගොපුරට්ටාලකද්වාරාදීන් විසිතුරුවූ හෙයින්ද විකසිත පඤ්චවර්ණ පද්මෝත්පල සඤ්ඡන්න මධුර ජල සම්පූර්ණ පුෂ්කරණීයෙන් හා ම දර පුවිඳු කුඳ වකුන පුන්නාග නාගතාල නම් ලබ්ජ්තාල වකුල ඛර්ජ්ජූරික කුමුන බු ජම්බු ජම්බීර පනස පාටලී කෙතකාසොක චම්පකාදි නිත්‍ය ඵල නිත්‍ය පුෂ්පයෙන් යුක්ත නොයෙක තරුගණසංඝාතයෙන් සකල ජන මනොනන්දනීයවූ වෙළුවන මහා විහාරයෙහි; විහරති, මෛත්‍රී කරුණා මුදිතා උපෙක්ෂා යන චතුර්විධ අපරිමිතාපට බ්‍රහ්ම විහරණයෙන් යුක්තව වැඩවාසය කර වදාරණසේක.

අථ ඛො, එකල්හි වනාහි; ආයස්මා, ආයුෂ්මත්වූ; අඤ්ඤාකොණ්ඩඤ්ඤො, අඤ්ඤාකොණ්ඩඤ්ඤ ස්ථවිරතෙම; සුචිරස්සෙව, ඉතා දීර්ඝ කාලයකින්ම; භගවා, භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ; යෙන, යම්

තැනෙක්හිද; තෙන, එතනට; උපසංකමි, එළඹියේය; උපසංකමිත්වා, එළඹ; භගවතො, භාග්‍යවතුන්වහන්සේගේ: පාදෙසු, පාමුල්හි; සිරසා, මස්තකයෙන්; නිපතිත්වා, වැඳවැටී; භගවතො, භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ; පාදනි, පාද පත්මයන්; මුඛෙනච, මුඛයෙන්ද; පරිචුම්බති, සිඹියි; පාණිහිච, දෑතින්ද; පරිසම්බාහති, පිරිමදියි; භගවා, භාග්‍යවත් බුදුරජාණන්වහන්ස; අහං, මම; කොණ්ඩඤ්ඤො ඉති, කොණ්ඩඤ්ඤයයි; නාමඤ්ච, නාමද; සාවෙති, අස්වයි; අථඛො, ඉක්බිත්තෙන්; ආයස්මතො, ආයුෂ්මත්වූ; වංගීසස්ස, වංගීස ස්ථවිරයන්වහන්සේට; එතදහොසි, මේ සිතවිය; අයංඛො ආයස්මා අඤ්ඤාකොණ්ඩඤ්ඤො, මේ ආයුෂ්මත් අඤ්ඤා කොණ්ඩඤ්ඤ ස්ථවිර තෙමේ වනාහි; සුචිරස්සෙව, ඉතා බොහෝ කල කිස්ම; යෙන භගවා, භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද; තෙන, එතනට; උපසංකමි, එළඹියේය; උපසංකමිත්වා, එළඹ; භගවතො, භාග්‍යවතුන්වහන්සේගේ; පාදෙසු, පාදමූලයන්හි; සිරසා, මස්තකයෙන්; නිපතිත්වා, වැඳවැටී; භගවතො, (ලෞකික ලොකොත්තර හිතසුඛ නිෂ්පාදක දාන සීලාදි කොටිප්‍රාප්ත භාග්‍ය ඇති) බුදුරජාණනවහන්සේගේ; පාදනි, පාදයන්; මුඛෙනච, මුඛයෙන්ද; පරිචුම්බති, වෙනසින් සිඹී; පාණිහිච, දෑතින්ද; පරිසම්බාහති; වෙසෙසින් පිරිමදී; භගවා, භාග්‍යවත් බුදුරජාණන්වහන්ස; අහං, මම; කොණ්ඩඤ්ඤො ඉති, කොණ්ඩඤ්ඤය; සුගත; සෝභන ගමන් ඇති හෙයින් සුගත නම්වූ තථාගතයන්වහන්ස; අහං, මම; කොණ්ඩඤ්ඤො ඉති, කොණ්ඩඤ්ඤයයි කියා; නාමඤ්ච, නාමද; සාවෙති, අස්වයි; අහං; මම; ආයස්මන්තං, ආයුෂ්මත්වූ; අඤ්ඤාකොණ්ඩඤ්ඤං, (මම) අඤ්ඤාකොණ්ඩඤ්ඤ ස්ථවිරයන් වහන්සේට, භගවතො, භාග්‍යවතුන්වහන්සේගේ; සම්මුඛා, ඉදිරියෙහි; සරූපාහි සුදුසුවූ; ගාථාහි, ගාථාවන්ගෙන්; අභිත්ථවෙය්‍යං, ස්තුතිකරන්නෙම් දැයි; යන්නූනාහං, ඉතා යෙහෙකැයි (කියායි) අථඛො, ඉක්බිත්තෙන් වනාහි; ආයස්මා, ආයුෂ්මත්වූ; වංගීසො, වංගීස ස්ථවිර තෙමේ; ආසනා, හුනස්නෙන්; උට්ඨාය, නැගිට; උත්තරාසඞ්ගං, උත්තරාසඞ්ගය; එකංසංකරිත්වා එකස්කොට පොරවා; භගවා, භාග්‍යවතුන් වහන්සේ; යෙන, යම් තැනෙක්හිද; තෙන, එතනට; (එවත් සර්වඥයන්වහන්සේට) අඤ්ජලිංපණාමෙත්වා, ඇඳිලි ප්‍රණාමයකොට; භගවන්තං, භාග්‍යවතුන්වහන්සේට; එතං, මේ වක්ෂ්‍යමාන කාරණය අවොච, සැලකෙළේය, භගවා, භාග්‍යවත් බුදුරජාණන්වහන්ස; මං, මට; පටිභාති, වැටහේ; සුගත, තථාගතයන්වහන්ස; මං, මට; පටිභාති, වැටහෝයයි කියායි; වංගීස, වංගීසය; තං, තුඹට; පටිභාතු,

විච්ඡෙත්වාති; භගවා, භාග්‍යවතුන්වහන්සේ; අවොච, වදාළසේක.
අථ ඛො, එකල්හි [illegible]; ආයස්මා [illegible]ගීසො, ආයුෂ්මත් වංගීස ස්ථවිර [illegible] සම්මු[illegible]; කොණ්ඩඤ්ඤස්ස, අඤ්ඤා [illegible]ණ්ඩඤ්ඤ [illegible] (ඉහ [illegible]) භගවතො, (ප්‍රවරතීක්ෂ්ණ [illegible] ර[illegible]ජිත [illegible] දීප්තිම රංසියන්නියවූ) භාග්‍ය[illegible]වතුන්වහන්සේගේ; [illegible] සදිසාහි; ස[illegible]පාහි, සුදුසුවූ; ගාථාහි [illegible]; අභිත්ථවි, ස්තුතිකෙළේය.

1 බුද්ධානුබුද්ධො යො ථෙරො කොණ්ඩඤ්ඤො තිබ්බනික්කමො
ලාභී සුඛවිහාරානං විවෙකානං අභිණ්හසො,

බුද්ධානුබුද්ධො (බුදුරජාණන්වහන්සේට දෙවැනිව චතුස්සත්‍යාවබෝධය කළ හෙයින්) බුද්ධානුබුද්ධවූ; තිබ්බනික්කමො, බහල වීර්‍ය ඇති; යො යො කොණ්ඩඤ්ඤො ථෙරො, ඒ කොණ්ඩඤ්ඤ ස්ථවිරතෙම; සුඛවිහාරානං, සැප විහරණ ඇති; විවෙකානං, කාය චිත්ත උපධි සංඛ්‍යාත ත්‍රිවිධ විවෙකයන්; අභිණ්හසො, නිබඳම; ලාභී, ලබන සුළුය.

2 යං සාවකෙන පත්තබ්බං සත්ථුසාසනකාරිනා
සබ්බස්ස තං අනුප්පත්තං අප්පමත්තස්ස සික්ඛතො,

සත්ථුසාසනකාරිනා, ශාස්තෲ ශාසනකාරිවූ; සාවකෙන, ශ්‍රාවකයෙකු විසින්; යං, යමක්; (සොතාපත්ති ඵල නිර්වාණ ධර්මයකට) පත්තබ්බං, අධිගත කටයුතුද; (නොහොත් පැමිණිය යුතුද) අප්පමත්තස්ස, අප්‍රමාදීව; සික්ඛතො, ත්‍රිවිධ ශික්ෂාවෙහි හික්මෙන්නාවූ යස්ස, යම් කොණ්ඩඤ්ඤ ස්ථවිරයන් විසින්; තං සබ්බං, ඒ සියල්ලම; අනුප්පත්තං අනුප්‍රාප්තය; (හෙවත් පැමිණියේය)

3 මහානුභාවො තෙවිජ්ජො චෙතොපරියකොවිදො
කොණ්ඩඤ්ඤො බුද්ධදායාදො පාදෙ වන්දති සත්ථුනො'ති

මහානුභාවො, මහත් ආනුභාව ඇති; තෙවිජ්ජො, ත්‍රිවිද්‍යා ඇති; (හෙවත් පූර්වේනිවාසානුස්මෘතිඥානය චුතූපපාතඥානය, ආශ්‍රවක්ෂයකරඥානය, යන ත්‍රිවිද්‍යා ඇති) චෙතොපරියකොවිදො, චෙතොපරිය ඥානයෙහි දක්ෂවූ; බුද්ධදායාදො, බුදුරජාණන් විසින් දෙනලද ධර්මදායාද ඇති; කොණ්ඩඤ්ඤො, කොණ්ඩඤ්ඤ ස්ථවිරතෙමේ; සත්ථුනො, ශාස්තෲන්වහන්සේගේ; පාදෙ, පාද පද්මයන්; වන්දති, වඳී; ඉති හා ප්‍රකාර කෙරේ.

නිසිතං

o

## සවිස්තර භාවසන්නය.

——— :ං: ———

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස.

——— :ං: ———

ශ්‍රීමත් ධර්ම භාණ්ඩාගාරික ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ විසින් ප්‍රථම ධර්මසංගායනා කාලයෙහි ප්‍රකාශකරණලද්දක්, ප්‍රවර විමලාතුල්‍ය කීර්ති සාගරායුස්මත්වූ මහා කාශ්‍යපස්ථවිරයන්වහන්සෙ සර්ව ජන හෘදයානන්දකරවූ මේ අඤ්ඤතිත්ථිය සූත්‍රාන්ත ධර්ම දේශනාව මවිසින් මෙසේ අසන ලදි නොහොත් මාගේ ඇසීම මෙසේ වෙයයි වදලසේක. ඒ කෙසේද යත් "ගම්භීරාවක්‍රාන්තත්‍යාදී වාදය සමයන් අනුරෙන් කාරුණ්‍යකෘත්‍යසමය සංඛ්‍යාතවූ එක් ධර්මදේශනා සමයෙක්හි" සර්ව සුරාසුර මනුජ ගරුඩ ගාන්ධර්ව විබුධ ජන කුමුදු වන විකාසන අසම සම සොම්‍ය ගුණ සම්බිම්බ සන්නිභ; සාත්‍යන්ත පරිශුද්ධ ස්නිග්ධ මෘදු තරුණකරවරණාලංකෘත සුවර්ණවර්ණදේහ ශ්‍රී සාර විරාජිතානන්‍ය සාධාරණ අසරණ සරණ වජ්‍ර පඤ්ජරාධාර කාරුණ්‍ය නිධාන ජිනවර දිපද්‍යෝතකවූ අප තථාගතයන්වහන්සේ මහා මන්ධාතු ගෝවින්දාදී නරේන්ද්‍රයන් විසින් අධිගෘහීතවූ හෙයින් රාජ ගෘහ නම්වූ දේශයේ නොහොත් ඉසිගිලිවෙහාර වෛපුල්ල පාණ්ඩව ගිජ්ඣකූට යන පර්වතරාජයන්ගෙන් පරික්ෂිප්තවූ හෙයින් රාජගෘහ නම්වූ ප්‍රාකාර පුරප්‍රවරසන්නිවේශයෙහිවූ ලෙහෙනුන්ට අභය දානය දීමෙන් හා දෙනලද බත් වැටුප් ඇති හෙයින්ද කලන්දකනිවාපනම්වූ හුන වනයකින් වටවූහෙයින්ද ගෝපුරට්ටාලකවාටාදීන් ජන මනෝනන්දනීයවූ වේළුවන මහ විහාරයෙහි වැඩවාසයකර වදාරණසේක. (තවද සකල ජන වන්දනීයවූ අප තථාගත සම්මා සම්බුද්ධරජාණන් වහන්සේ රජගහනුවර ගොදුරුගම්කොට ස්ථාන ගමණ සයනාදී ප්‍රභෙද ඇති චතුර්විධ ඊර්යාපථ බ්‍රහ්ම විහරණයෙන් යුක්තව වැඩ වාසයකර වදාල වේළුවනාරාමය කුමන අර්ථයකින් කලන්දකනිවාප නම් වීද යත්? පූර්වකාලයෙහි එක්තරා රජකෙනෙකු උයන් ක්‍රීඩා පිණිස වේළුවන උයනට පැමිණියේ සුරා මදයෙන් මත්ව දහවල් රුකක් මුල සයනයකෙළේය. ඔහුගේ පිරිවර ජනයාද අපගේ රජ තෙම නිද්‍රාවට පැමිණියේයයි සලකා පුෂ්ප ඵල පල්ලවාදීන් පොළඹ වනු ලබමින් ඔබිමොබ ගියේය. ඉක්බිත්තෙන් එක්තරා රුක්සිදුරෙක හුන් කෘෂ්ණ සර්පයෙක් තෙම සුරා ගඳ ආඝ්‍රාණයකොට රජහු ඉදිරියට ඒයි. වෘක්ෂ දෙවතාතොම එය දැක රජහුගේ දිවි දෙමැයි සිතා ලෙහෙන වෙස් රැගෙණ විත් රජහු කන ලග සබ්දකෙළේය. එක

මෙහෙසි රජතුමෙ නින්දෙන් පිබිද බලනුයේ සිහිනා දැක මේ ලෙසා නුඹ ඊජන් ... දිවි ද්‍රත්නාගයි සිතා එනනාහී ලෙෂගනුන්ට බත් වැටුප් තරාබවා මෙබඳ ලෙගෙනුන්ට හිඹිවෙතු අනතුරා නොකාරවයි ස්යා අභාසෝහනයද නොලේය. එහෙයින්ම මෙපළවන උයනෙනගි කරණලද ආරම්භ කලපදකතිවාපන මීවිය) එකල්හි වනාගි ආයුෂ්මත් අඤ්ඤාකොණ්ඩඤ්ඤ ස්ථවිරයන්වහන්සේ බොහෝ කලකින් මෙ එන් දෙමල ස අවුරද්දක්නුගේ ඇවෑමෙන් සමෙපීශවයසී ප්‍රණිධානඃ ශ්‍රී සංකල්ප සිද්ධිප්‍රස්ථාන යන ශාඩ්ගුණ්‍යතාවයෙන් පරමෝත්කෘෂ්ට ඕඩයට පැමිණි භාග්‍යවත්වූ සම්‍යක් සම්බුද්ධ සර්වඥ රාජෝත්තමයානන් වහන්සේ යම් තැනෙකක්හිද එතනට නොවත් වේළුවන මහ විහාරයට එළඹ බුද්ධරාජානන් වහන්සේගේ පා පියුම් මුල මස්තකයෙන් වැද වැටී භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රීපාදවන්දය මුහුනින්ද සිඹිසි. දෙහතින්ද පිරිමදී. ස්වාමිනි භාග්‍යවත් බුදුරජාණන් වහන්ස මම කොණ්ඩඤ්ඤය සොභාග ගති ඇති හෙයින් සුගත නම්වූ තථාගතයන් වහන්ස මම කොණ්ඩඤ්ඤයයි කියා නමත්ගේ නාම කිතීනයද කළසේක. මේ කොණ්ඩඤ්ඤ ස්ථවිරතුමේ ගෞතම තථාගත ශාසනයෙහි සියළු ශ්‍රාවකයන්වහන්සේලාට පෙරටුව දුක්ඛ සමුදය නිරෝධ මාර්ග යන චතුරතර චතුරාර්‍යසත්‍යාවබෝධය සඳහා ඒකා සඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි පිරූ පාරමිතා ඇතිසේක. තවද පශ්චිම භවයෙහි (නොහොත් නිර්වාණ ධර්මාවබෝධය කරණ මේ අන්තිම භවයෙහි කොණ්ඩඤ්ඤ නමින් බ්‍රාහ්මණ වංශෝද්භූතව ඍග්‍යජූර් සාම යන වේදත්‍රයෙහි පාරගත පිය් පැණ ගුණැති සුප්‍රසිද්ධ පණ්ඩිත රත්නයක්ව සුවනෙන් වසනුයේ සුද්ධෝදන මහ රජහු පුත්වූ සිද්ධාර්ත කුමරුවෝ පැවිදිවූහයි අසා භද්දිය වප්ප මහානාම අස්සජි යන අන්‍ය බ්‍රාහ්මණ පණ්ඩිතයන් සතරදෙනෙකු හා ලෝකාර්ථකාරී සිද්ධාර්ථ කුමරුන් උදෙසා ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව බොහෝ කල් සහචාරිව වැස පසුව බරනැස ඉසිපතනාරාමයෙහිදී දම්සක් පැවතුම් සූත්‍ර දේශනාවෙන් එදල පළමු දම් දෙසුම් අසා දහසක් නයින් ප්‍රතිමණ්ඩිත සෝවාන් ඵලයට පැමිණියෙන් නිවන් සිරි සුව ලදුයේ අඤ්ඤාසි වතභො කොණ්ඩඤ්ඤො අඤ්ඤාසිවතභො කොණ්ඩඤ්ඤො යනු වෙන්වදල මේ තථාගත උදානය හෙයින්ම අඤ්ඤාකොණ්ඩඤ්ඤ නම් වූයේය. මෙසේ සකල ලෝකෝත්ත කල්‍යාණ මිත්‍රකරවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේම දෙවැනිව මහානුභාසම්පන්න සියළු තථාගත ශ්‍රාවකයන් වහන්සේලාට පළමුව පරම රමණීය අමාමහ නිවන් සිරි සුව ලද හෙයින්ද දසදහසක් සක්වළ දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍යාදීන් අතුරෙහි පතල යසෝ ඝෝෂාවක් ඇතිව විසුසේක. එකල්

හි වනාහි පිඩු පිණිස හැසිරෙන සියළු භික්ෂු සංඝයාවහන්සේ වැඩී මහළු පිළිවෙළින්ම හැසිරෙන් ධර්මදේශනා කාලයෙහි වූ රත්න මණ්ඩපයෙහි පනවන ලද විසිතුරු බුද්ධාසනයෙහි තථාගතයන් වහන්සේ වැඩහුන් කල්හි උන්වහන්සේට දකුණු පාර්ශ්වයෙහි සාරි පුත්‍රස්ථවිරයන් වහන්සේද වාම පාර්ශ්වයෙහි මහා මෞද්ගල්‍යායනස්ථවිරයන් වහන්සේද වැඩහිඳිත්. උන්වහන්සේලාට පසු භාගයෙහි අඤ්ඤාකොණ්ඩඤ්ඤ ස්ථවිරයන්වහන්සේට අනුරූපාසනයක් පනවනු ලැබෙයි. එය පිරිවරා සෙසු භික්ෂූහු වැඩහිඳිත්. අග්‍ර ශ්‍රාවක සාරිපුත්‍ර මෞද්ගල්‍යායන යන දෙදෙනාවහන්සේලාට වත්මයන් නිර්වාණාවබෝධය කළ බැවින්ද තමන්වහන්සේලාට වඩා මහළු හෙයින්ද අඤ්ඤාකොණ්ඩඤ්ඤ ස්ථවිරයන් වහන්සේ කෙරෙහි ගෞරව සහිතවූවාහු පිළිපස හිඳිනා ඒ තෙරුන්වහන්සේ මහා බ්‍රහ්ම රාජයා මෙන්ද ගිණි කඳක් මෙන උග්‍ර විස ඇති සර්ප රාජයෙකු මෙන්ද සලකන්නාහු බුරුසනයන්හි හෙවත් අග්‍ර ශ්‍රාවක ධූර පිළිබඳ ආසනයන්හි හිඳින්නාහු ලජ්ජා භය සහිත වෙත්. එහෙයින් අඤ්ඤාකොණ්ඩඤ්ඤ ස්ථවිරයන් වහන්සේ සිතනුයේ; මේ අග්‍ර ශ්‍රාවක දෙදෙනාවහන්සේ වූකලී බුරුසන සඳහා ඒකාසංඛ්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි පුරණ ලද පාරමිතා ඇත්තෝය — අග්‍ර ශ්‍රාවක ධූර පිළිබඳ නියම ආසනයන්හි වැඩ හුන්නාවූ මේ දෙදෙනා වහන්සේ දත් මා නිසා ලජ්ජා භය සහිත වෙත්. එහෙයින් මොවුන්ට වූ විසරණයක් ඇතිකරන් නම් යෙහෙකැයි සිතා සුදුසු අවස්ථාවෙක්හි තථාගත බුද්ධරජානන් වහන්සේ කරා එළඹ ස්වාමීනි ඡද්දන්තාවනයෙහි විසීම සඳහා මට අවකාශ දුන මැනවැයි යාඥාකොට අවසර ලැබගෙන හිමාලය වනයෙහි ඡද්දන්ත වන පෙදෙසෙහි වූ මන්දාකිනී නම් සිත් සාව විල් තෙරට වැඩම්කල සේක.—— එකල්හි එහි පුවී නාලිස පසේ බුදුවරයන් වහන්සේලාගේ ආශ්‍රයෙන් පුරුදුවූවත් පිළිවෙත් ඇති අටදහසක් පමණ හස්ති ශ්‍රේෂ්ඨයෝ තෙරුන්වහන්සේ දුන අපව පින් කෙතක් පැමිණියේයයි සිතා ඔව්හු තමන් පා තියවලින් සත්මන තෘණ රහිත කොට අත්‍යන්ත සිද රංගෙණ අඤ්ඤාකොණ්ඩඤ්ඤ ස්ථවිරයන් වහන්සේගේ විසීම සඳහා කුටියක්ද කොට පිළිවෙලින් වත් නිමවා සියල්ලෝම රැස්ව මෙසේ සත් කෙට කල හුය, කෙසේද යත් ඉදින් අපි සියල්ලෝම අසවලා අසවලා තෙරුන්වහන්සේට කටයුතු වතාවත් කෙරෙත්නයි සිතන්නෙමු නම් උන්වහන්සේට බොහෝ තැයන් ඇති ගමසාද ගියාක්මෙන් වෙයි. එහෙයින් අපි වාර බෙද්කැණ්මෙන් උපස්ථාන කරන්නෙමු. එසේ ඇති කල්හි වාරය පැමිණී හස්තියා විසින් උපස්ථාන කටයුතුවම ය සෙසු අය

විසින්ද පමාණනොවීවන් පිළිවෙත් කටයුතුයයි කියාසි. එතැන් පටන් විරාජ පැමිණි ඇත් නෙමේ උදාසනම දැහැටි දඬු හා ලූව දෙර්ානා පැන් තැබීම ආදී සියළු වත් පිළිවෙත් අනුනාව නොවර්ජය ~~ මේ මන්දකිනි පුෂ්කරණී නොහොත් විශාල පහන් යොදුන් පමණ මහතැනතිය. එම පුෂ්කරණීහුගේ මධ්‍යයෙහි පසළොස් යොදුන් පමණ තැන් සෙවෙල් හෝ පෙණ නොමැතිව පලිඟු මෙන් පිරිසිදු ඇහුවණී ජලයෙන් ගැබ්වියේය, ඉන් අවට කටි ප්‍රමාණ ගැඹුරැ ජල පිහිටි තන්හි අඩ යොදුන් පුළුලැති නෙල පියුම් වනයකින් ඒ පහස් යොදුන් පමණැති මන්දකිනි නම් පුෂ්කරණිය සියාරා සිටියේවිය ඉන් ඔබ්බෙහි එපමණම පැතිරුනු රත් පියුම් වනයක්ද, ඊට අනතුරුව හෙවත් එසේ පිටින් එසේම රත් කුමුදු වනයක්ද එසේම ඊට අනතුරුව සුදු කුමුදු වනයක්ද, ඊට අනතුරුව නීලෝත්පල වනයක්ද, ඊට අනතුරුව රක්තෝත්පල වනයක්ද, ඊට අවටින් සුවඳ රත් හැල් වනයක්ද, ඊට අනතුරුව කැකිරි ලබු කොමඩු ආදී මිහිරි රසවත් ඵල සහිත වැල් වනයක්ද, ඊට අනතුරුව අඩ යොදුන්ම පුළුල්වූ උක් වනයෙක්ද වූහ. එහි උක් දඬු පුවක් ගස් පමණ මහතැත්තේ වෙයි. ඊට අනතුරුව ඵල සහිත කෙසෙල් වනයෙක්ද විය. එහි ඉදී ගිය කදලි ඵල දෙකක් අනුභවකරන්නහු කලානත මෙන් එපමණ මහතැත්තේය. ඊට අනතුරුව මහ හැලි පමණ මහත්වූ ඵල සහිත කොස් වනයෙක්ද ඉන් ඔබ්බෙහි අඹ දඹ ජම්බුල් ආදී වනයෝද වූහ. ලුහුඩින්ම මේ මන්දකිනි විල් පෙදෙසෙහි අනුභව කටයුතුවූ අඹවල් නම් ඵල විශේෂ නැතැයි නොකියහැක්කේය.

මල් පිපෙන තමයෙහි පියුම් පත්හි වැටෙන්නාවූ පුෂ්පරේණුයෝ ජලයෙන් සමී මිශ්‍රව සූර්ය්‍ය තාපයෙන් පැසී උනුව සවිවූ යකඩ ගුලි මෙන් සුසැදී තිබෙත්, පොකුරු මිනම්වූ මේ මධුරාහාරයද රැගෙණ අසදෘශ කොණ්ඩඤ්ඤ නම් මහ රහතන් වහන්සේට පිළිගන්වත්. ඒ පුෂ්කාරණියෙහි නෙලුම් දළිනගුලිස් පමන මහතැත්තෝය. හෙද රැගෙණ පිළිගන්වත් නෙළුම්බල මිනිබර මුව පමණ වෙයි. එහි එක් සිදුරෙක්හි කලයක් පමණ ක්ෂීර ධාරා ඇත්තේ විය හෙද රැගෙණ පිළිගන්වත් පත්ම බීජයෝ මී හා සකුරා සමග යොදා සදත්. උක් දඬු ගල් මතුපෙහි තබා පයින් මැඩීමෙන් වැගිර යන උක් රසයෝ ඒ ඒ තන්හි සූර්ය්‍ය තාපයෙන් පැසී කිරිගල් පිඬු මෙන් ඝනව සුසැදී තිබේ. හෙද රැගෙණ පිළිගන්වත් කොස් කෙසෙල් අඹ දඹ ආදී මොනවට ඉදී ගිය නානාවිධ ඵලාඵල සපයාගෙණ විත් පිළිගන්වන්නාහුය යනු කුමට කියමිද ~~ කෛලාස පර්වතයෙහි නාගදත්ත නම් දිව්‍ය පුත්‍රයෙක් වාසයකරේ අසදෘශ කොණ්ඩඤ්ඤ ස්ථවිරයන් වහන්සේ

කලින් කල ඒ දෙව් පුත්හුගේ සිත් දොරට පැමිණ වැඩීම ලකුරයි. එකල්හි දිව්‍ය පුත්‍ර තෙම තෙරුන්වහන්සේට අමෘත ගිතෙල් හා පොකුරු මී සුනු යුත් උදක රහිත ක්ෂීරපායාසයෙන් පාත්‍රය පුරා දෙයි; ඒ දෙව් පුත් තෙමේ කාශ්‍යප තථාගත ශාසනයෙහි විසි දහසක් අවුරුදු සුවඳවත් ගිතෙලින් යුත් ක්ෂීර සලාක දනයන් දුන්නේය. එම කුසල මහිමයෙන් දෙව් පුත් හට ඒ දිව බොජුන නිබඳ පහලවෙයි. තෙරුන්වහන්සේ මෙසේ දෙලොස් අවුරුද්දක්ම ඒ මන්දකිනි පිල් තොර වැස තමන්වහන්සේගේ ආයු සංස්කාරය දිවැසින් බලනුයේ ක්ෂයව ගිය බැව් දැන කොතැන්හි පිරිනිවන් පාන්නෙම්දෝහෝයි සිතනුයේ දෙලොස් අවුරුද්දක් මට උපස්ථාන කරන්නාවු හස්ති ශ්‍රෙෂ්ඨයන් විසින් දුෂ්කරවූවක්ම කරණ ලද්දේය, එසේ හෙයින් ශාස්තෘන්වහන්සේව අනුදැන්වා මේ හස්තියාගේ සමීපයෙහිම පිරිනිවන් පාන්නෙමැයි නිශ්චය කරගත්සේක; මෙසේ පිරිනිවන් පෑම සඳහා කරණ ලද නිශ්චය ඇති තෙරුන්වහන්සේ අහසට පැණනැගී සර්වඥ රාජොත්තමයානන්වහන්සේ වැඩහුන් රජගහනුවර කලන්දකනිවාප නම් අඹවන නාමොපලක්ෂිත වේළුවන මහ විහාරයට වැඩමවා බුදුන් දක සිරිපා සිඹ දෙපතින් පිරිමදිමින් ස්වාමිනි භාග්‍යවත් බුද්ධරාජානන් වහන්ස මම කොණ්ඩඤ්ඤය සුගතයන්වහන්ස මම කොණ්ඩඤ්ඤයයි කියා නමද ප්‍රකාශ කලසේක.

කුමක් හෙයින් නාම කීර්තනයෙන් තමා හැඳින්වූසේක්ද යත්; සකල ජනහිත තථාගත සර්වඥ රාජොත්තමයානන් වහන්සේ සමග පිළිසඳර කථාබස් කරණ මා නොහඳුනන්නෝ මේ සුදුවූ කෙස් ඇති කැදුවූ නාකි මහණතෙම කව්දෝහෝයි සිත් දූෂ්‍යකොට අපායගාමීහු වෙත්. මා හැඳිනීමෙන් දසදහසක් සක්වලෙහි ශාස්තෘන්වහන්සේ මෙන් සුප්‍රසිද්ධ මහා ශ්‍රාවක තෙමෙතැයි මා කෙරෙහි භක්ත්‍යාදර උපදවා ප්‍රසන්නව බොහෝ සත්වයෝ ස්වර්ගපරායන වෙත්යයි සලකා අපාය මාර්ගය වසා ස්වර්ග මාර්ගය විවෘතකරමින් තමන් වහන්සේ හැඳින්වූසේක්. එකල්හිවනාහි ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිරයන් වහන්සේට මෙබඳු අදහසෙක් වූයේය. මේ ආයුෂ්මත් අඤ්ඤාකොණ්ඩඤ්ඤ ස්ථවිරයන්වහන්සේ ඉතා දීර්ඝ කාලයකින් හෙවත් දෙලොස් අවුරුද්දක්හුගේ ඇවෑමෙන් අනේකවිධ ප්‍රාතිහාර්‍ය රූපයෙන් යුක්තවූ භාග්‍යවත් බුද්ධරාජානන් වහන්සේ යම් තැනෙක්හිද එතනට හෙවත් වේළුවනාරාමයට වැඩමවා භාග්‍යවතුන්වහන්සේගේ පාමුල්හි වැඳ වැටී තථාගතයන්වහන්සේගේ ශ්‍රීපාද පද්මය සම මුහුනින්

සිඹීමෙන් හා දෙයතින් පිරිමැදීමද කරමින් ස්වාමීනි භාග්‍යවත් බුද්ධරජාණන් වහන්ස: මම කොණ්ඩඤ්ඤය සුගතයන්වහන්ස මම කොණ්ඩඤ්ඤයයි කියා තමන් වහන්සේගේ නාම කීර්තනයද කරණලේක, එහෙයින් මම මේ ආයුෂ්මත් අඤ්ඤා කොණ්ඩඤ්ඤ ස්ථවිරයන්ට භාග්‍යවතුන්වහන්සේගේ ඉදිරියෙහි සුදුසුවූ ගාථාවන්ගෙන් ස්තුති කරන්නෙම් නම යෙහෙකැයි කියායි; ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිරතෙමේ හුනස්නෙන් නැගී සිට උත්තරාසඞ්ගය නැවත සකස් කිරීම් වසයෙන් ඒකාංසකොට පෙරවා භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද එතනට ඇඳිලි බැඳගෙණ බුද්ධරජාණන් වහන්සේට මේ වක්ෂ්‍යමාන කාරණය සැලකලසේක. භාග්‍යවත් බුද්ධරජානන්වහන්ස මට වැටහෙයි සොඳුරු ගමන් ඇති තථාගතයන්වහන්ස මට කරුණු වැටහේයයි කියායි; වඞ්ගීසය නුඹට වැටහේවායි සෙවත් වැටහෙන යමක් ඇතහොත් එය ප්‍රකාශකරවයි භාග්‍යවතුන්වහන්සේ වදාලසේක.

මේ වඞ්ගීසස්ථවිර තෙමේ දසබලධාරී භාග්‍යවත් බුද්ධරජාණන් වහන්සේ කරා එලඹින්නාහු තථාගත සම්මා සම්බුද්ධරජාණන් වහන්සේ මේ මේ ගුණ කාරණකොටගෙණ චන්ද්‍ර සූර්‍ය්‍යයන් හා සමානය අවකාශය සමානය මහා සමුද්‍රය සමානය හස්තිරාජයෙකු සමානය අභීත කේසර සිංහ රාජයෙකු සමානය යනාදීන් උපමාකොට නොයෙක් පද සිය දහස් ගණනින් තථාගතයන්වහන්සේගේ ගුණ වර්ණනාකරමින්ම පැමිණෙයි එහෙයින්ම ගෞතම තථාගත ශාසනයෙහි වහා කරුණු වැටහීම් ඇති ශ්‍රාවකයන් අතුරෙන් අග්‍ර තනතුරු ලත් සේකි. ඒ වඞ්ගීසස්ථවිරයන් වහන්සේගේ පූර්ව ප්‍රාර්ථනාව මෙසේ දතයුතු. කෙසේදයත්? යටගිය දවස පියුමතුරානම් බුදු සසුන් පවත්නා සමයෙහි හංසවතී නම් නුවර මහත් උප භෝග පරිභෝග සම්පත් ඇති කුලයක ඉපිද නුවන මුහුකුරා ගිය බැවින් වෙහෙරට ගොස් බුදු දම් අසන කරමින් සිටියේම ඒ පියුමතුරා නම් බුදුරජාණන් වහන්සේ තමන්වහන්සේගේ ශාසනයෙහි වහා කරුණු වැටහීම් ඇති ශ්‍රාවකයන් අතුරෙන් මේ භික්ෂුතෙම අග්‍රයයි කියා එක් භික්ෂුවක්හට තනතුරු දුන්සේහු දක බුදුන් පලමු මහ සඟහට සත දන්දී මමද අනාගතයෙහි කිසියම් බුද්ධසසුනෙක්හි වහා වැටහීම් ඇති භික්ෂූන් අතුරෙන් අග්‍රවෙම්වායි ප්‍රාර්ථනා කරණ ලදින් ඒ බුදු රජාණන් වහන්සේ විසින්ද ඊට විවරණශ්‍රී දී වදාලසේක්. දිවි ඇතිතාක් කුසල්කොට ඒ කුසල මහිමයෙන් දෙව් මිනිස් දෙගතියෙහි සෞභාගයක් සැප විඳිමින් අවුත් මේ බුද්ධොත්පාදයෙහි සැවැත් නුවර

එක්තරා බමුණු කුලයක උපන්නේ ඕහට වඞ්ගීසමානවකයයි නම් කළාහුය. හෙතෙම නුවණැති බවට පැමිණීමෙන් ඍග්යජුර් සාම යන වේදත්‍රය ඉගෙණීමෙන් හා ආචාරීන් සතුටුකොට ඡවසීසනම් විසිතුරු මන්ත්‍රයෙක්ද ඉගෙණ මිනී හිස් කබලකට ඇඟිලි පිට නියෙන් ගසා මෙතෙම අසවල් ආත්මයෙහි උපන්නාහයි කියන්ට හැකිව විසූයේය.

බ්‍රාහ්මනයෝ මෙය අපට ජීවිකාව පිණිස යහපත් මගෙකැයි සිතා වඞ්ගීසමානවකයාව ප්‍රතිවජ්ජනා යානාවක්හි හිඳුවාගෙණ ගම් නියම්ගම්රාජධානි පිළිවෙලින් හැසිරෙමින් නගරවාරයෙහි හෝ නියම් ගම් දොරටුවෙහි හෝ යානාව තබා මහ ජනයා රැස්වූ කල්හි යමෙක් වඞ්ගීසමානවකයා දකීද හෙතෙම වස්තුව හෝ යසස් හෝ ලබයි සවර්ගයට හෝ යෙත්යයි කියත් එබස් ඇසූ මහ ජනයා මිල දී හෝ වඞ්ගීසමානවකයා දකිනු කැමතිවෙත්. රජරාජ මහාමාත්‍යාදීහු ඔවුන් වෙත පැමිණ ආචාරීන්ගේ දනුම් කෙබඳුදැයි විචාල කල්හි නුඹවහන්සේලා නොදන්නෙහිය මුළු දඹදිවම අප ආචාරීන්ට සමාන පණ්ඩිත කෙනෙකු නැත්තාහ තුන් වර්ෂයක් තුල මිල කෙනෙකු හිස් කබලට නියපිටින් ගසා මෙතෙම අසවල් තැන උපනැයි කියාද ප්‍රකාශ කරන්නේයයි කී කල්හි වඞ්ගීසතෙමේද මහ ජනයාගේ සැක දුරලීම පිණිස ඒ ඒ ජනයන් ගෙන්වා තම තමන්ගේ ගතියද කියවත්. එහෙයින් මහ ජනයා අතින් සිය දහස් ගණන් වස්තුවද ලත්හ; බ්‍රාහ්මණයෝ වඞ්ගීසමානවකයා රැගෙණ යම්සේ කැමති තාක් දුර හැසිර නැවත සැවැත්නුවරට පැමිණියාහුය. වඞ්ගීසතෙම ජේතවන මහ විහාරයට නුදුරු තන්හි නැවතුනේ මෙසේ|සිතුයේය, ශ්‍රමණ භවත් ගෞතමයෝ බොහෝ පණ්ඩිතයයි ලෝ වැස්සෝ කියත් එහෙයින් /හැම කල්හි මොවුන්ගේම බස් රැගෙණ හැසිරෙන්ට නොවටනේය පණ්ඩිතයන්ගේ සමීපයටද යායුතුයයි සිතා හෙතෙම අන්‍ය බ්‍රාහ්මනයන්ට කියනුයේ තෙපි යව මම ටිකදෙනෙකු සමග ගොස් ශ්‍රමණ භවත් ගෞතමයන් දක්නෙමියි කියේය. එවිට අන්‍ය බ්‍රාහ්මනයෝ කියනුයේ වඞ්ගීසය තුඹ ශ්‍රමණ භවත් ගෞතමයන් දක්නට අදහස් නොකල මැනව ඒ මහත ගොයුම් වෙත පැමිණි බොහෝදෙන මායාවෙන් ආවර්තනය කෙරේයයි කියේය, වඞ්ගීසමානවකතෙමේද ඔවුන් බස් පිළිනොගෙණ ශාස්තෘන්වහන්සේ වෙත පැමිණ මිහිරි පිළිසඳර කථාකොට එකත්පසෙක හුන්නේය. එවිට තථාගතයන්වහන්සේ වඞ්ගීසය කිසි යම් ශිල්පයෙක් දනිදැයි විචාරා වදාලසේක්. එසේය භවත් ගෞතමයන්වහන්ස ඡවසීස නම් මන්ත්‍රයෙක් දනිමියි කීයේය. ඒ මන්ත්‍රයෙන් කුමක් කෙරේද යත්

සීල අධි චිත්ත අධිප්‍රඥ යන ත්‍රිවිධ ශික්‍ෂාවන්හි හික්මෙන්නාවූ මේ අඤ්ඤකොණ්ඩඤ්ඤ ස්ථවිරයන් වහන්සේ ඒ සියල්ලටම පැමිණියේය — මහත් ආනුභාව ඇතියේක. ත්‍රිවිද්‍යාප්‍රාප්තවූයේක හෙවත් පූර්වේ නිවාසානුස්මෘතිඥානය චුතිඋත්පත්තිඥානානුවතනය ආශ්‍රව ක්‍ෂයකරඥානය යන විද්‍යාත්‍රය ලත්තේක. චේතෝපරියඥානයෙහි අභිඥාවූයේක බුද්ධරජාණන් වහන්සේ විසින් දෙසන ලද ධම්මදායාද ඇති අඤ්ඤාකොණ්ඩඤ්ඤ ස්ථවිරතෙමේ දෙවියන් සහිත ලෝක සත්වයා වෙත ධම්මානුසාසනා කරණ හෙයින් සාස්තෘ නම් වූ බුද්ධරජාණන් වහන්සේගේ ශ්‍රීපාදද්වය නමස්කාර කෙළේයයි කියයි.

මෙසේ වඞ්ගීස ස්ථවිරයන් වහන්සේ විසින් ගාථාත්‍රයකින් ප්‍රකාශ කරණ ලද ස්තුති කථාව සමාප්තවූ කල්හි ආයුෂ්මත් අඤ්ඤකොණ්ඩඤ්ඤ ස්ථවිරතෙමේ භාග්‍යවත් බුද්ධ රජාණන් වහන්සේ සමග පිළිසඳර කථාකොට ස්වාමීනි බුද්ධරජාණන් වහන්ස මාගේ ආයු සංස්කාරය ක්‍ෂයව ගියේය. එසේ හෙයින් පිරිනිවන් පාන්නෙමැයි කියා පරිනිර්වාණ කාලය දන්වූයේක. කොණ්ඩඤ්ඤය කොතනදිදී පිරිනිවන් පාන්නෙහිදැයි භාග්‍යවතුන් වහන්සේ විචාරා වදාලසේක්, ස්වාමීනි දෙලොස් අවුරුද්දක් මුළුල්ලෙහි වත් පිළිවෙත් ආදියෙන් මට උපස්ථාන කලාවූ හස්ති ශ්‍රෙෂ්ඨයන් විසින් දුෂ්කරවූවක්ම කරණ ලද්දේය. එහෙයින් ඕහුන්ගේ සමීපයෙහිදී පිරිනිවන් පාන්නෙමැයි සැලකළසේක. ඉක්බිති ශාස්තෲන් වහන්සේ අනුදත් කල්හි ඒ අඤ්ඤකොණ්ඩඤ්ඤ ස්ථවිරතෙම භාග්‍යවතුන්වහන්සේ ප්‍රදක්‍ෂිණාකරමින් නමස්කාරකොට ස්වාමීනි බුද්ධරජාණන් වහන්ස මේ මාගේ ආදියෙහි වූද අන්තිමවූද, දක්මයයි ප්‍රකාශකොට මහ ජනයා හඬද්දීම වේළුවන මහ වෙහෙරින් නික්ම දොර කොටුවෙහි සිටියේ සෝක නොකරව් නොහඬව්, බුද්ධා වා හොන්තු බුද්ධ සාවකා වා උප්පන්නා සඞ්ඛාරා අභිජ්ජනකා නාම නත්ථීති, සර්ගත් සංස්කාර ඇති බුද්ධවරයෝ හෝ වේවා බුධශ්‍රාවකයෝ හෝ වේවා නොනැසෙන්නාවූ කිසිවෙක් නැතැයි යනාදීන් මහ ජනයාට අවවාද දී අහසට පැන නැගී මහ ජනයා බලා සිටිද්දීම මන්දකිනී විල් තෙර බැස එනම් පුෂ්කරණියෙහි ස්නානයකොට හැඳ පොරවා තමන්වහන්සේගේ සෙනසුන සකස්කොට තබා එදින රාත්‍රිය පිළිබඳ ප්‍රථම යාමාදි ත්‍රිවිධ යාමය ඵල සමවතින් ඉක්මවා ඉතා උදැසන් අනුපාදිසෙස නිර්වාන ධාතුවෙන් පිරිනිවන් පා වදාලසේක — තෙරුන් වහන්සේගේ පරිනිර්වාණය සමග හිමවත සියළු වෘක්‍ෂයෝ මල් ඵලවලින් ඕනතවිනත

වූවාහුය. එසේවත් විශේෂයෙන් නැමුනාහුය. එදින උපස්ථානකළ වාරය පැමිණි හස්තිරාජයාතෙම තෙරුන්වහන්සේ පිරිනිවි බැව් නොදත් හෙයින් අළුයම මුව දෝනා පැන් හා දැහැටු දඬු ආදිය තබා වත්කොට අනුභව කටයුතු මීකිරි ඵලාඵල වැල ඵලවා තබා සක්මන් කෙලවර බලා සිටියේය. තෙරුන්වහන්සේ එදින තමා ඇතුළත් කුටියෙන් පිටත නික්මීම පවා නොදක්නා හස්තිරාජයාතෙම සිතනුයේ මේ කිමෙක්දෝහෝ ආර්යයන් වහන්සේ පෙර දවස්හි උදෑසන නම සක්මන්කෙළවරෙහි මුව දෝවනය කරයි අද වූකලී පන්සලින්ද පිටත නොනික්මුන සේක්ගයි සලකා කුටියදොර විවෘතකොට බලනුයේ තෙරුන්වහන්සේ සැතපී හුන්නාහු දැක සොඬ දිගුකොට ආශ්වාස ප්‍රාශ්වාසයන් ඇත්තේදෝහෝයි පරීක්ෂා කරණුයේ නොපැවති බැව් දැන තෙරුන්වහන්සේ පිරිනිවන් පෑසේක්යයි නිශ්චය වශයෙන් සලකමින් සොඬ මුව තුල බහා මහත්සේ සබ්ද නගා හැඬූයේය. සියළු හිමවත එකනින් නාදවිය අටදහසක් හස්ති ශ්‍රේෂ්ඨයෝ පැමිණ තෙරුන්වහන්සේගේ මෘතදේහය ජ්‍යෙෂ්ඨ හස්ති රාජයාගේ කුම්භස්ථලය මතුයෙහි තබා සෙසු හස්තිහු සුපුෂ්පිත එක එක අතු කැබෙල්ලක් බැගින් රැගෙණ පිරිවරා හිමවත මුළුල්ලම පෙළහරකොට පළමු ස්ථානයටම පැමිණියාහුය —— ශක්‍ර දේවේන්ද්‍ර තෙමේද විශ්වකර්ම දිව්‍ය පුත්‍රයාට ආමන්ත්‍රනයකොට දරුව අපගේ වැඩි මහළු සහෝදරවූ අසුසූකොණ්ඩඤ්ඤ ස්ථවිරයන්වහන්සේ පිරිනිවන් පෑ වදලසේක සත්කාර කරන්නෙමු එහෙයින් නව යොදුන් සපී රත්නමය කූටාගාරයක් හෙවත් රන් සිවි ගෙයක් නිර්මිතකරවයි කීයේය. ඔහුතෙම එකනෙහි දිව අවුත් එසේ කොට තෙරුන්වහන්සේගේ මෘත සරීරය එහි තොවා හස්තිරාජයන් අතටම දුන්නාහුය. ඔව්හු නව යොදුන් සපී රත්නමය රන් සිවි ගෙය ඔසවා රැගෙණ තුන් දහසක් යොදුන් හිමවත නැවත නැවතත් පෙලකර කරමින් අනුප්වරණය කළාහුය. නැවත ඒ හස්තීන්ගේ අතින් ආකාසස්ත දෙවියො රැගෙණ සාධු ක්‍රීඩා කලාහුය ඔවුන්ගේ අතින් වස්සවලාහක දෙවියෝද ඔවුනතින් සීතවලාහක දෙවියෝද ඔවුනතින් උණ්හවලාහක දෙවියෝද ඔහුනතින් චාතුර්මහාරාජික දිව්‍ය ලෝක වාසී දෙවියෝද ඔවුනතින් තව්තිසා වැසි දෙවියෝද යනාදී ක්‍රමයෙන් පරනිර්මිත වසවර්ත්ති දිව්‍යලෝකවාසී දෙවියෝද නැවත බ්‍රහ්මපාරසද්‍යාදී බඹලෝ වැසියෝද ඔවුනොවුන්ගේ අතිනතින් අසුසූකොණ්ඩඤ්ඤ ස්ථවිරයන් වහන්සේගේ මෘතදේහය සහිත සවර්ණමය කූඨගෙය රැගෙණ පෙලහර කරමින් ගෙණ ගියෝය නැවත ඒ ඒ බ්‍රහ්ම ලෝක වාසී බ්‍රහ්ම රජයන්ගේ අතිනතින් අවුත්

පරනිර්මිත වසවර්තීන්හාදී දෙවියන්ටද ඔවුනොවුන් විලිවිලියේ වින් අවදානයක් පමණ හස් ශ්‍රේෂ්ඨයන්වම තෙරුන්වහන්සේගේ මාහා ඉද්ධය සහිත රන් සිවි ගෙය පැමිණියේය — නැවත ආදගනෝන් සවය සඳහා එක් එක් දෙවනාවෙක් සතරගුල් පමණ සඳුන් ගැටය බැගින් නෙණ ඊමෙන් තනනලද විතකාන තව යොදුහ්ම උස්වීය කදනතනරව තෙරුන්වහන්සේගේ ඉද්ධය සහිත රන් සිවි ගෙය විසඳා නිවීතකාලයෙහි සැබූ කල්හි රජගහ නුවරින් අහසට නැගී අනුරුධ ස්ථවිරයන් වහන්සේ ප්‍රමුඛ පන්සියයක් මහ රහතන් වහන්සේලා වැඩමවාගෙණ සඤ්ඤාගතා කලාහුය. අනුරුධ ස්ථවිරයන් වහන්සේ ධර්මදේශනා ද කලසේක — බොහෝ දෙවියන්ට ධර්මාව බෝධවූවාහුය. ඒ පන්සියයක් රහතුන් වහන්සේලා දෙවෙනි දවස්හි අරුණෝද්ගමන වේලාවෙහිම විනකයෙහි ගිණි නිවා සමන් මල් කැකුළු වැනි ධාතූන් පෙරහණක පුරාගෙණ ගොස් භාග්‍යවත් බුද්ධරජාණන් වහන්සේද ගඳකිළියෙන් නික්ම පෙර ගමන් වැඩමවා වේළුවන දෙරටුවෙහි වැඩ සිටි සේක් ශාස්තෘන් වහන්සේගේ ශ්‍රී හස්තයෙහි තැබූසේක බුද්ධරජාණන් වහන්සේ ධාතු පෙරහණ පිළිගෙණ මහා පෘථිවිය දෙසට ශ්‍රී හස්තය දිගුකලේය එකෙණෙහි පෘථිවිය විදා ඊව රිදී බුබුලක් සමාන චෛත්‍යයක් පැණ නැන්ගේය එම චෛත්‍යයෙහි භාග්‍යවත් අප සම්මා සම්බුද්ධ රජාණන් වහන්සේගේ ශ්‍රී හස්තයෙන්ම ධාතු පෙරහන නිධාන කලසේක් ඒ අඤ්ඤාකොණ්ඩඤ්ඤ ස්ථවිර මහ රහතන් වහන්සේගේ ධාතු පිහිටි චෛත්‍යය බොහෝ කල් නිරුපද්‍රව පැවැත්මෙන් බොහෝ සත්වයෝ දෙව් මිනිස් සැප හා පරම රමණීය බෙමාති සුන්දරතර අමාමහ නිවන් සම්පත් සිඩකරගත්සේක —

ශ්‍රී සද්ධර්ම චක්‍රවර්ත්ති ස්වාමිවූ අප සම්මා සම්බුද්ධ සසුන්හි සියළු ශ්‍රාවකයන් වහන්සේලා අතුරෙන් පලමුකොට නිර්වාණධර්මාවබෝධය කිරීමෙන් තනතුරු ලත් මේ අඤ්ඤාකොණ්ඩඤ්ඤ ස්ථවිර මහ රහතන් වහන්සේගේ පූර්ව ප්‍රාර්ථනාව පිළිබඳ අනු පිළිවෙල කථාව සැකෙවින් මෙහි දක්වනු ලැබේ —

ඒ කෙසේද යත්, මේ මහා භද්‍රකල්පයට ලක්‍ෂයක් කපින් මත්තෙහි ලෝ පහළවූ පියුමතුරා නම් සම්මා සම්බුද්ධරජානන් වහන්සේ මහ ජනයාට අනුග්‍රහ පිණිස ගම් නියම්ගම් රාජධානි පිළිවෙලින් පිඩු පිණිස හැසිර හංසවතී නුවරට වැඩමවා එහි කරවන ලද ආරාමයෙක්හි වැඩ වාසය කොට වදාලසේක —

එසමයෙහි මේ අඤ්ඤාකොණ්ඩඤ්ඤ ස්ථවිරතෙම හංස
වතී නුවර මහාසාර කුලයෙක්හි උපන්නේ එක් දවසක
ධර්මදේශනා කාලයෙක්හි හංසවතී නුවර වැසියෝ බුදුන් යම්
තැනෙක්හිද ධර්මය යම් තැනෙක්හිද සංඝයා යම් තැනෙක්හිද එදි
සාවට අවනතව ප්‍රාග්භාරව ගඳ මල් ඈ ගත් අත් ඇතිව යන්නාවූ
මහ ජනයා සමග ධර්මදේශනා ස්ථානයට එළඹියේය. එසමයෙහි
එනාහි පියුමතුරා නම් බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේගේ
ශාසනයෙහි පළමුකොට ප්‍රතිවේධ කරණ ලද ධර්ම ඇති එක් භික්ෂු
කෙනෙකුන් ඒ තග්‍රස්ථානයෙහි තබා වදාලසේක. කුල පුත්‍රතෙම ඒ
කාරණය දැක මේ භික්ෂූන්වහන්සේවූකලී මහ පිනැතියේක සර්වඥ
යන් වහන්සේ හැර මුන්වහන්සේම පළමුව ධර්ම ප්‍රතිවේධය කළ
අනික් කෙනෙක් නම් නැත්තේය. මමද එක් බුදු සස්නෙක්හි පළමු
කොට ධර්ම ප්‍රතිවේධ කරන්ට සමර්ථවන්නෙම් නම් ඉතා යෙහෙ
කැයි සිතා, දම් දෙසුම් කෙළවර බුදුන් කරා එළඹ හෙට දවස මාගේ
භික්ෂාව පිළිගන්න මැනවැයි පැවරීය. බුදුහු එය ඉවසා වදාළසේක,
තදනන්තරව බුදුන් වැඳ පැද කුණුකොට තමාගේ ගෙට ගොස්
සකල රාත්‍රියෙහි බුදුන් වැඩ හිඳිනා තැන සුවඳ මල්දමින් සරසා
ප්‍රණීත ඛාද්‍ය භෝජ්‍යාදිය පිළියෙල කරවා රැය ඉක්ම ගිය කල
ලක්ෂයක් පිරිවර භික්ෂූන් සහිත තථාගතයන් වහන්සේ තම ගෘහ
යෙහි වඩා හිඳුවා විසිතුරු කැඳ අවුලුවෙන් යුත් නානා සූප ව්‍යඤ්ජ
නාදීන් යුත් සුගන්ධ සාලි භෝජ්‍ය වළඳවා බත් කිස කෙළවර
තුන් සිවුරු පිණිස එඬග වස්ත්‍රයන් බුදුන් සිරිපාමුල තබා සිනහුයේ
මම මහත්වූ තනතුරක් පතමින් හැසිරෙණ බැවින් එක් දවසක්ම
දන් දී එබන්දක් පැතීම නුසුදුසුය පිළිවෙළින් සත් දවසක්හි මහ
දන් දී ප්‍රාර්ථනා කරන්නෙමැයි යනිටුහන්කොට හෙතෙම එම නියා
යෙන් සතියක් මහ දන් දී බත් කිස කෙළවරහි වස්ත්‍ර කොට්ඨල
විවෘතකරවා උතුම් සියුම් වස්ත්‍ර තථාගත පාමුල්හි තබා ලක්ෂයක්
මහ සඟනට තුන් සිවුරු පුදකොට භාග්‍යවත් බුදුරජාණන් වහන්
සේ කරා එළඹ ස්වාමිනි බුදුරජාණන් වහන්ස නුඹවහන්සේ විසින්
මෙයින් සත්දිනකින් මතුවෙහි ඔබ ඒ භික්ෂු කෙනෙක් ඒ තග්‍රස්ථාන
යෙහි තබන ලද්දේද, එමෙන් මමද මතු පහළවන බුදුකෙනෙකුන්
ගේ සස්නෙක්හි පැවිදිව පළමුකොට ජීවිතාණ ධර්මය ප්‍රතිවේධ කරන්ට
පොහොසත්වෙම්වායි කියා ශාස්තෘ පාදමූලයෙහි මස්තකයෙන්
වැදහොත්තේය. ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ ඔහු වදන් අසා
මේ කුල පුත් තෙමේ මහත් අධිකාරයෙක් කරණ ලද්දේය. මොනු
ගේ චෛතසිකතාව සිදුවේදෝහෝයි අනාගත දැන මෙසේ බොහා

වදාල කල්හි සිදුමත බැව් දැක බුදුරජාණන් වහන්සේ ඕහට මෙසේ වදාළසේක.—— එම්බා කුලපුත්‍රය මෙයට ලක්ෂයක් කපින් කොලවර ගණාංගනයෙහි ගෞතම නම් බුදු කෙනෙක් උපදනාහ. හුඹ ඒ බුදුන්ගේ පලමු දම් දෙසුම්වන ත්‍රීපරිවර්ත ධම්මචක්කප්පවත්තන සූත්‍රාවසානයෙහි අවලොස් කෙලක් බඹුන් හා සමග දහසක් කසින් ප්‍රතිමණ්ඩිත උතුම් සෝවාන් පෙලෙහි පිහිටන්නේයයි කීය. කුල පුත්‍රයාව චීවරණ දී වදාළසේක, තදනන්තරව ශාසනාන් වහන්සේ සුවාසූ දහසක් ධර්මස්කන්ධයන් දේශනාකර වදරා නිරුපධිශෙෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පෑසේක, පිරිනිවියාවූ ඒ තථාගතයන් වහන්සේගේ ශ්‍රී ශරීරය රන් කඳක්සේ ඒකඝනව සිටියේය. රුවන් මුවා ගඩොලින් හා සිරියල් මනෝසිලයෙන් මැටි කිසද තලතෙලින් දිය කිසද කරණ ලදුව බඳිනලද උන්වහන්සේගේ ධාතු චෛත්‍යය සත් යොදුනක් උස්වූයේය, බුදුන් ජීවමාන කල්හි ශරීර ප්‍රභාව දොලොස් යොදුනක් තන්හි පැතිර පැවැත්තේය. පිරිනිවියාවූ ඒ සර්වඥයන් වහන්සේගේ ශරීරයෙන් රශ් කලඹ නික්ම සියක් යොදුන් තැන පැතිර පැවැත්තේය. චීවරණ ලත් සිටු පුත් තෙමේ බුදුරජාණන් වහන්සේගේ ශරීර චෛත්‍යය වටකොට රුවන් ඇඟෑ දහසක් කරවීය සැය පිහිටුවන දිනයෙහි චෛත්‍යාභ්‍යන්තරයෙහි රුවන් ගෙයක්ද කරවිය හෙතෙම හවුරුදු ලක්ෂයක් මුළුල්ලෙහි මහත්වූ දනාදී පින්කම්කොට එයින් සැව දෙව් ලොව උපන්නේය. දෙව් මිනිස් දෙගතියෙහි සැරි සරන්නාවූ ඕහට සාවානූ දහස් නවසිය නව කල්පයක් ඉක්මුනාහුය. මෙතෙක් කල් ඇවෑමෙන් මේ මහා භද්‍ර කල්පයට ඒකානූ කපකින් යට මේ කුල පුත්‍රතෙම බන්ධුමතී නුවර දෙර ගම්හි කෙලණී ගෙයක උපන්නේය. ඕහට මහාකාලයයි නමෙක් විය. ඕහට චූලකාල නම් මලනු කෙනෙක්ද වූයේය. එසමයෙහි විපස්සී බෝධිසත්වතෙම තුසී පුරයෙන් සැව අවුත් බන්ධුමතී නුවර බන්ධුම රජහුගේ අග මෙහෙසිය කුස ඉපිද අනුක්‍රමයෙන් බුද්ධ රාජ්‍යව පැමිණ දහම් දෙසනු පිණිස මහ බඹහු විසින් ආරාධිතවූසේක් කවරෙක්හට පලමුව දහම් දෙසන්නෙම්දෝහෝයි සිතා තමන්වහන්සේගේ මලණුවූ ඛණ්ඩ නම් රජ කුමර තෙමේ සහ තිස්ස නම් පෙරවි බමුනු පුත් තෙමෙත් ධර්ම ප්‍රතිවේධයට සමර්ථයෝහයි දැන ඔවුන්ට දහම් දෙසමි . පිය රජහටද සංග්‍රහ කරන්නෙමැයි සිතා වදරා බෝ මැඩින් අහසට නැගී විත් "ඛෙමම්ගදය" නම් උයණහි බැස ඔවුන් කැඳවා ඔහු වදාළ කල්හි සුවාසූ දහසක් ප්‍රාණීන් සමඟ දෙදෙනම අර්හත්වයෙහි පිහිටියාහුය. ඉක්බිති බෝසත් කල්හි අනුව පැවිදිවූ අනූසූ. සුවාසූ දහසක් කුල දරුවෝ බුදුන් සමීපයට

එලඹියාහු සුගත් දම් අසා රහත් පෙළෙහි පිහිටියාහුය ශාස්තෘන් වහන්සේ එතන්හිම ඒ බණ්ඩ සංවිරයන් අග සව් තනතුරෙහිද් තිස්ස සංවිරතෙමෙ දෙවැනි අග සව් තනතුරෙහිද තබාලූසේක. රජතෙමේත් එපවත් අසා පුතනුවන් දකිනු පිණිස උයනට ගොස් දම් දෙසුම් අසා තිසරණෙහි පිහිටා දෙවන දින භික්ෂාව පිණිස පවරා සකසා වැද පැද කුතුකොට නික්ම ගිය රජ තෙම ප්‍රා .ාදවරගතව හිඳ මෙසේ සිතීය. මා දෙටු පුතනුවෝ මහාභිනික්මන් කොට බුදු වූහ විතීය පුත්‍රතෙම අග සව් වූයේය පුරෝහිත පුත්‍රතෙම දෙවැනි ශ්‍රාවක වූයේය. අවසෙස භික්ෂූහු වනාහී ගිහි කල්හිද මපුතනුවන් පිරිවරාම හැසුරුණාහුය මේ සියල් ලෝම පූර්වයෙහිද දූනුදු මටම භාරයහ එහෙයින් මමම උපස්ථානකරම් අන්‍යයන්ට අවකාශ නො දෙමැයි සිතා වෙහෙර දිහසල් දොරටුව පවත් රජ වාසල දක්වා මග දෙපස කිහිරි පවුරක් කරවා වස්ත්‍රයෙන් වසා මත්තෙහි රන් තරුයෙන් විසිතුරුවූ එලෙන විවිධ මල්දම් ඇති වියනක්ද කරවා විසිතුරු අගනා ඇති රියෙන් බිම අතුරුවා ඇතුලත මග දෙපස මල් ගස් පුන් කලස් තබ්බවා සියළු මාගීය සුවද ගන්වා භාග්‍යවතුන්වහන්සේට කල් දන්වූයේය. සර්වඥ දිවාකර තෙම භික්ෂු සංඝයා විසින් පිරිවරණ ලදුව රාජ භවනයට වැඩ අහර කිස නිමවා විහාරයට වඩනාසේක, මේ නියායෙන් කල් ගතවන කල්හි නගර වාසීහු සිතූහ ශාස්තෘන්වහන්සේ ලොව පහළව අදට සත් අවුරුදු සත් මහක් ගතවූහ මෙතෙක් කල් දක්නට පවා නොලත් හෙයින් දන් දීම් ආදියක් කෙසේ කරමුද රජතෙමේ මගේම රත්නත්‍රයයි මමත්වය කොට උපස්ථාන කෙරෙති ශාස්තෘන් වහන්සේ දෙවියන් සහිත ලෝකයාට වැඩ පිණිසම උපන්සේක, නරකයතෙම රපනව උෂ්ණවූයෙත් අන්‍යයන්ට නිලුපුල් වනයක් සේ සිහිල්වූයේත් නොවෙයි. ඉදින් අපට ශාස්තෘන්වහන්සේ නොදෙන්නාහු නම් රජහු සමග යුද්කොට නමුත් භික්ෂු සංඝයා රැගෙණ දනාදී පින්කම් කරම්හයි සලකා සෙනෙවි රදුන් වෙත එලඹ එපවත් සැලකොට කිමෙක අපට පක්ෂවන්නෙහුදැයි විචාලාහුය. එවිට සෙනෙවිතෙම කියනුයේ නොපව පක්ෂවෙමි එතකුදු වුවත් පලමු දිනය මට දිය යුතුයයි කීයේය. නගර වාසීහු එය පිළිගත් කල්හි සෙනෙවිතෙම රජවෙත එලඹ ශාස්තෘන් වහන්සේට තුඹම උපස්ථාන කරන්නාහුය අපි නොලබමුයයි කියා නගර වාසීහු ඔබවහන්සේට කිපියාහුය. දේවයන්වහන්ස දූනුදු නොලබන්නාහු නම් ඔබ හා සමග යුද කරනු කැමැත්තාහයි කීයේය. දරුවේ යුද කරන්නේ නමුදු භික්ෂු සඞ්ඝයා නොදෙමැයි කී කල්හි, දේවයන්වහන්ස ඔබ මෙතෙකර

වෙමි ඔබ හා සමග යුධ කරමිහයි කියති නුඹවහන්සේ කවරක්හු ගෙණ යුද කරන්නාහුදැයි විචාළේය, ඇයි දරුව නුඹ සෙවිරත් වූයේත් නොදැනිදැයි කී කල්හි දෙවියන්වහන්ස මම නුවර වැස්සන් හැර යුධයට පොහොසත් නොවෙමියි කීය ඉක්බිති රජතෙම සිත නුඹේ නුවර වැසියෝ බලවත්ව සෙනෙවිහෙයෙද්ද ඔවුන්ටම පක්ෂ යයි දූත අනික් සත් අවුරුදු සත් මසක් මටම දෙත්වයි කීය. නුවර වැසියෝ ඒ නොගිවිස්සාහ, රජතෙම සග අවුරුද්දෙක පස් අවුරුද් දෙකැයි ගම්මෙන් අඩුකරන්නාහු අනික් සත් දවසක් භික්ෂු සංඝයා ඉල්ලූහ නුවර වැස්සෝද එය ගිවිස්සාහුය, රජතෙම සත්. සවිරුදු සත මසකට කැරදු දූත මූබය සත් දිනකටම හරසා කිසි නොහෙ කු න්වින් හොද්ණුවාම සදවසක් දන් දී සත්වන දිනෙහි නුවරැන් කැඳවා දරුවෙනි මෙබඳු දනක් දෙන්ට හැක්කෙහිදැයි විචාළහ ඔබ්හු හැක්කෙමුයයි සැලකලාහුය, රජතෙම පිටි අතින් කඳුළු පිසි මින් බුදුන් වැඳ සවාමිනි සැට ලක්ෂයක් භික්ෂූන් අනිකක්හට භාර නොකොට දිවි ඇති තාක් මම උපස්ථාන කරන්නෙමැයි සිතූයෙම් භාග්‍යවත් බුද්ධොත්පාදයන් වහන්ස නුවර වැස්සෝ අපට දන් දෙන්ට නොලැබෙත්යයි කිපෙති එබැවින් මා විසින් බුදුන් ඇතුළු මහ සඟ නට උපස්ථාන කිරීම් නුවරැන්ට අනුදන්නේක සෙට දවස පටන් ඔවුන්ට අනුග්‍රහ කළ මැනවැයි සැලකලාහුය. ඉක්බිති දෙවන දින සෙසෙනවිතෙම මන දන් දුන්නේය නැවත නුවර වැස්සෝ රජ්ජුරු වන් කළ සත්කාරයට ඉතා අධිකවූ සත්කාර සම්මානකොට දන් දුන්නාහුය. මේ නියායෙන් සකල නගර වාසීන්ගේ දන පරම්පරාව ගත විමෙන් වාරග්‍රාමවාසීහු සත්කාර සම්මාන සැපයූහ මහා කාල කෙලෙඹිතෙමේ මලනු චූලකාලයින්ට කියනුයේ තථාගතයන් වහන්සේට හෙට දවස සත්කාර කිරීම අපට පැමිණෙයි. කෙබඳු සත්කාරයෙක් කරමෝදැයි කීය. මෑයන්වහන්ස නුඹම දැනගන මැනවැයි කියේය. ඉදින් මාගේ රුචියක් කරන්නෙම් නම් සොළොස් කිරියක් පමණවූ අප හැල් කෙතෙහි ගැබ් ගත්තාවූ හැල් ගොයම් ඇත්තාහ. බිණ්ඩි පලා හැල් බඩ ගෙණ බුදුරජාණන්වහන් සේට සුදුසු අහරක් පිසවමුයයි කීය. මෙසේ කිරීම කිසිවක් හටත් උපකාරයෙක් නොවෙයි එහෙයින් මට එය රුචි නොවන්නේයයි කීහ. ඉදින් නුඹ එසේ කීයන්නෙහි නම් මම මාගේ කොටස කැමැත්තක් කරම්යි කියා හැල් කෙත දෙකට බෙද අව කිරියක් තන්හි ඉමී තබ්බවා මහා කාල කෙම තම කොටසෙහි හැල් ගැබ් පලා රැගෙණ දිය නොමුසු කිරෙන් පියවා චතුමධුර බහා බුදු පාමොක් මහසඟනට දුන්නාහුය, හැල් බඩ පලාගත්තැන් නැවත පිරිගියේය.

මේ නියායෙන් පුප්ඵකගණාදයගණාදී වශයෙන් එකම සත්‍යයෙක් නම වාරයෙහිම අග්‍ර සත්‍ය දක්නා ප්‍රදානය කෙළේය. ඒ සත්‍යයද ඉතා වැඩියක්ම සම්බන්ධවිය. යම් තාක් සම්බුද්ධයන් වහන්සේ ජීවමානව වැඩ සිටියාහුද තෙමේත් යම් තාක් ජීවත්විද ඒ තාක් කල් එම නියායෙන්ම පින්කම්කොට එයින් සැව දෙව්මිනිස් දෙගතියෙහි අනුපස් කල්පයක් මුළුල්ලෙහි සැප විඳ අප බුදුන් ලෝ පහළවූ කල කිඹුල්විත් පුරයට නුදුරු තැන ද්‍රෝණ වස්තු නම් බමුණු ගම බ්‍රාහ්මන මහා සාර කුලයෙක ඉපිද කොණ්ඩඤ්ඤ මානවකයයි ප්‍රසිද්ධවූහ, හෙතෙම නුවනැති බවට පැමිණ වේදත්‍රය ඉගෙන ලක්‍ෂණ මන්ත්‍රයන්ගේ පරතෙරට ගියාහුය. එසමයෙහි අප මහ බෝසතානන්වහන්සේ තුසී පුරයෙන් සැව අවුත් කිඹුල්වත් පුරයෙහි ඉපිද වදාළසේක, උන්වහන්සේට නම් තබන දින අෂ්ටෝත්තරශතයක් බමුණන් නව වස්ත්‍ර හඳවා අල්පෝදක මධු පායාස අනුභව කරවා ඔවුනතුරෙන් අටදෙනකු තෝරා රජගෙණ මතු මගල්තෙලෙහි හිඳුවා සරහා පිළිසෙළ කරණ ලද බෝසතානන් වහන්සේව දුහුල් සුමුළුයෙක හොවා ලක්‍ෂණ පරිග්‍රහණය පිණිස ඔවුන් වෙත ගෙණ ගියාහුය, එවිට ප්‍රධානාසනයෙහි හුන් බමුණු නම ඇතුළු බ්‍රාහ්මනයෝ සත්දෙනාක්ම මහ බෝසතානන් වහන්සේගේ ශරීර සම්පත්තිය බලා ඉදින් මෙතෙම ගිහි ගෙයි විසූයේ නම් සක්විති රජ වන සේක, පැවිදි වූ නම් බුදු වන සේකැයි දෙගතියක් දක්වා දෙඇඟිල්ලක් එසවූහ. ඔවුනතුරෙන් හැමට බාලවූ කෘතාධිකාර ඇති පශ්චිම භවික සත්ව කෙනෙක් වූ විසාරද ප්‍රඥා සම්පත්ති ඇති කොණ්ඩඤ්ඤ මානවක තෙම බෝසතානන් වහන්සේගේ ශරීර ලක්‍ෂණවර සම්පත් බලා මේ ලක්‍ෂණයෙන් යුත් කෙනෙකු ගිහි ගෙයි විසීමෙක් නම් නැත. මූන් වහන්සේ එකාන්තයෙන්ම සව් කෙලෙස් සිඳ බුද්ධවන සේක්යයි එක් ගතියක්ම දක්වා එක් ඇඟිල්ලක් එසවීය. බ්‍රාහ්මනයෝද තම තමන් වාසස්ථානවලට පැමිණ පුත්‍රයන් කැඳවා කියනුයේ දරුවෙනි අපි මහලුවූම්හ. සුදොවුන් මහ රද පුත් සිදුහත් කුමරතෙම එකාන්තයෙන් බුදුවන සේක, තෙපි ඒ කුමාරතෙම බුදුවූ කල උන්වහන්සේගේ සසුනෙහි පැවිදිවෙත්වායි කීවාහුය. සුදොවුන් මහ රජතෙමේද බෝසතානන් වහන්සේට කිරි මව් දසි දසාදීන් තබා කුමාර පෙළ කරින් වඩිනයට පැමිණවූහ, මහ බෝසත් තෙමේත් වැඩිවිය පැමිණ දෙව් කුමරෙකු මෙන් සම්පත් අනුභවකොට කාමයෙහි ආදීනව හා නෛෂ්ක්‍රම්‍යයෙහි අනුසස් දක්නා රහල් කුමර උපන් දින ඡන්නාමාත්‍ය සහායකොට කන්ථක නම් අශ්වාරූඪව දෙවියන් විසින් හළ දොරින් මහාභිනිෂ්ක්‍රමන් නික්ම එම රාත්‍රියෙහිම රට තුනක් ඉක්මවා

අනෝමා නදී තීරයෙහිදී ඝටිකාර නම් මහ බ්‍රහ්ම විසින් එළවනලද අටපිරිකර රැගෙණ පැවිදිව සියක් වස් මහ තෙර කෙනෙකු මෙන් ප්‍රසාදවතවූ ඉරියව්වෙන් යුක්තව රජගහ නුවරට පැමිණ පිඬු සිඟා පාණ්ඩව පර්වත ඡායාවෙහි වැඩසිද අහර වළඳා මගධ රජතෙම රාජ්‍ය යෙන් පවරණ ලදුව එය ප්‍රතික්ෂෙප කොට අනුක්‍රමයෙන් උරුවෙල් දනව්වට වැඩමකොට ප්‍රධන් වීර්‍ය වැඩීම පිණිස මෙය සුදුසු භූමියෙ කැයි සලකා එහි වාසය කළසේක එසමයෙහි කොණ්ඩඤ්ඤ බ්‍රාහ්ම ණයා හැර අන්‍ය බ්‍රාහ්මණයෝ සත්දෙනම කම්වූ පරිදි මිය පරලොව ගියාහුය. හැමට තරුණවූ ලක්ෂණ පරිග්‍රාහක කොණ්ඩඤ්ඤමාන වක තෙමේ නිශ්චයිවූයේය, මෙතෙම මහ බෝසතාණෝ පැවිදිවූහයි අසා ඒ බ්‍රාහ්මණයන් සත්දෙනාගේ දරුවන් කරා එළඹ පින්වත්නි සිදුහත් කුමරතෙම පැවිදිවූ සේක්ය. නිසැකවම හෙතෙම බුදු වන් නාහ. ඉදින් තොපගේ පිතෘහු නිරුපද්‍රැතවූහු නම් අද්‍ම පැවිදි වන් නාහුය. ඉදින් තෙපිත් කැමැත්තහු නම් එව් මම ඒ මහෝත්තම යන්ට අනුව පැවිදි වන්නෙම්යි කීයේය, එවිට ඔහු හැමදෙනම එකමච්ඡන්දවීය නුනුණුවාහු සතරදෙනෙක් කොණ්ඩඤ්ඤ බ්‍රාහ්මණ යා ප්‍රමුඛකොට ගෙණ පැවිදිවූවාහුය. මේ පැවිජ් පස්දෙන ගම් නියම් ගම් රාජධානි පිළිවෙලින් පිඬු සිඟා ඇවිදිනානු බෝසතාණන් වහන් සේ වෙතට පැමිණියාහුය, ඔවුහු මහ බෝසතාණන් සාවුරුද්දක් මහා වීර්‍ය කරණ කල්හි "දැන් බුදුවන්නාහ දැන් බුදුවන්නාහයි" සිතමින් මහ බෝසතාණන්ට උපස්ථාන කරන්නාහු උන්වහන් සේට සමීපාවචරම වූවාහුය, මහ බෝසතාණන් වහන්සේ නම් කාලෙක එක් තල සහලැටක් ආදින් වළඳ දුෂ්කරකාරිත්වයෙන් ආර්‍ය ධම්ම ප්‍රතිවේධය නොවන බැව් දැන ඔළාරිකාහාර පරිභෝග කළ සේක්ද එකල්හි ඒ පැවිජ් පස්නම බෝසතාණන් වහන්සේ හැර ගොස් ඉසි පතනයට පැමිණියාහුය. ——— ඉක්බිති බෝධිසත්වයන් වහන්සේ ඔළාරිකාහාර පරිභොගයෙන් සිව් මස් ලෙහෙ පරිපූර්ණකොට වෙසග පුණු පොහෝ දින සුජාතා නම් සිටු දියනිය විසින් එළවන ලද වර භොජ්ජන් වළඳ රන් තලිය උඩුගං යවා අද බුදුවන්නෙමැයි කරණ ලද සතිටුහන් ඇතිව සවස් වේලෙහි කාළ නම් නාරදහු විසින් නොයෙක් ස්තුති ශතයෙන් වර්ණනා කරණු ලබමින් මග දෙවූ මැඩව නැගී අචලස්ථානයෙහි නැගෙණහිරි ලෝක ධාතුවට අභිමුඛව පලක් බැඳ වැඩ සිට චතුරඞ්ග සමන්විත වීර්‍යාධිෂ්ඨාන කොට හිරු අස්තයට නොපැමිණි කලම මාර බල විධමනය කොට පූර්ව යාමයෙහි පෙර විසූ කඳ පිළිවෙල සිහිකොට මැදුම් යම දිව්‍යැස් පහයා අළුයම අනුරෙහි ප්‍රතීත්‍ය සමුත්පාදයෙහි ඥානය බසා අනු


ලෝම ප්‍රති ලෝම වශයෙන් ප්‍රත්‍යාවෘත්තය සම්මර්ශනය කිරීමෙන් සියළු බුදුවරයන් විසින් ප්‍රතිවේධ කරණ ලද සර්වඥතාඥානය අවබෝධ කොට නිවන් අරමුණුකොට පැවති ඵල සමවතින් එහිම සතියක් කල් ගැවූ සේක, මේ නියායෙන් බෝ මැඬසි සත් සති යවා කිරි පලු රුක් මුලෙහි මී පිඬු බොජුන් වලඳ නැවත අජපාල නිග්‍රෝධ මුලයට පැමිණ එහි වැඩ හුන් සේක් ධර්ම ගම්භීරත්වය ප්‍රත්‍යවේක්ෂා කොට මන්දෝත්සාහී බවට සිත නැමෙන කල්හි මහ බඹහු විසින් අයදනා ලදුව බුදු ඇසින් ලොව බලා මදරජ තීක්ෂ්ණේන්ද්‍රියාදී ප්‍රභේදගත සත්ත්ව ජනයන් දැක දම් දෙසුම් පිණිස මහ බඹහට ප්‍රතිඥාදී මම පළමුව කවරෙක් හට දහම් දෙසන්නෙම්දෝහෝයි සිතා ආලාර උද්දක යන තාපසයන් දෙදෙන කළුරිය කළ බැව් දැන නැවත සිතන සේක් උරුවෙල් දනව්වෙහි දුෂ්කරක්‍රියා කරණ සමයෙහි මට බොහෝ උපස්ථාන කළාවූ පඤ්ච වර්ගීය භික්ෂූන්ට පළමුව දහම් දෙසන්නෙම් නම් යෙහෙකැයි සිතා වදාළසේකී, තවද අඤ්ඤාකොණ්ඩඤ්ඤ බ්‍රාහ්මණයන් හැර පළමුව ධර්ම ප්‍රතිවේධයට පොහොසත්වූ අන් කිසි මිනිස් කෙනෙක් නැත්තේමය. මේ අර්ථය සඳහාම කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි අධිකාර කර්ම කෙළේය. බුදු පාමොක් මහ සඟ රුවනට එකම ශබ්දයෙන් නව වාරයක් අගයස් දන් දුන්නාහු.----- ඉක්බිත්තෙන් ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ පා සිවුරු රැගෙණ ක්‍රමයෙන් ඉසිපතනාරාමයට වැඩ පඤ්ච වර්ගීය භික්ෂූන් යම් තැනෙක්හිද එහි වැඩමකළ සේක, ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ වඩනාහු දැක තමන් කතිකාවෙහි පිහිටිය නොහැකිවූවාහු එක් නමක් පා සිවුරු පිළිගත්හ එක් නමක් අසුන් පැනවූහ එක් නමක් පා දෙවුන් දිය එලවා තැබීය එක් නමක් පා දෙවූයේය එක් නමක් තල් වැට ගෙණ පවන් සැලීය. මෙසේ වත් දක්වා බුදුන් සමුවෙහි හුන් කල්හි ශාස්තෘන් වහන්සේ කොණ්ඩඤ්ඤ තෙරුන් කාය සාක්ෂි කොට ගෙණ ත්‍රිපරිවෘත්ත දම්සක් පැවතුම් සූත්‍රාන්තය දේශනා කරන්ට ආරම්භ කළ සේක, මිනිස් පිරිස පස්දෙනෙක්ම වූහ, දෙව් පිරිස අප්‍රමාණවිය දේශනා කෙළවර කොණ්ඩඤ්ඤ ස්ථවිරතෙම අටලොස් කෙලක් බ්‍රහ්මයන් සමග සෝවාන් පෙළෙහි පිහිටි සේක, එකල්හි ශාස්තෘන් වහන්සේ අපමණ දුෂ්කර ප්‍රතිපදාවෙන් මවිසින් ගෙණනලද ධර්මය පළමුකොට අවබෝධ කළ හෙයින් මෙතෙම අඤ්ඤාකොණ්ඩඤ්ඤන්මැයි තෙරුන්වහන්සේට ආමන්ත්‍රණය කරමින්" අඤ්ඤාසි වත භො කොණ්ඩඤ්ඤො අඤ්ඤාසි වත භො කොණ්ඩඤ්ඤො "යන් මේ ප්‍රීති වාක්‍යය වදාළසේක, තෙරුන්වහන්සේට එයම නාමය විය

මෙසේ ඒ අඤ්ඤාකොණ්ඩඤ්ඤ ස්ථවිරතෙම ඇසළ පුර පසළොස්වක් ද සෝවාන් පෙළෙහි පිහිටියේය, අව පෑළවී දින භද්දිය ස්ථවිරයන් වහන්සේද දියවක් දින වප්ප ස්ථවිරයන් වහන්සේද තියවක් දින මහා නාම ස්ථවිරයන් වහන්සේද ජලවක් දින අස්සජි ස්ථවිරයන් වහන්සේද සෝවාන් පෙළෙහි පිහිටියාහුය. විසේනිය දින අනාත්ම ලක්ෂණ සූත්‍රාන්ත දේශනාවසානයෙහි හැමදෙනා වහන්සේම අර්හත් ඵලයෙහි පිහිටියේය, එසමයෙහි මිනිස් ලොව රහතන් වහන්සේලා සදෙනමක් වීදාසමානවිය. එතැන් පටන් ශාස්තෘන් වහන්සේ යස කුල පුත්‍රාදි විනේජනයන්ට ධර්මාමෘත පානය කරවා බොහෝදෙන සමග මොක් සැපෙහි පිහිටුවා දඹදිව් තෙලෙහි තම බුදු සසුන් වඩා මුළු දඹදිව කාශාය වස්ත්‍රයෙන් බබුළුවා. භික්ෂු භික්ෂුණී සඞ්ඛ්‍යාත සෘෂීන්ගේ ගමනා ගමනයෙන් ජනිත චීවර වාතයෙන් ප්‍රතිවාත කරණසේක් එක් සමයෙක්හි දෙව්රම් මහ වෙහෙර වැඩ වාසයකාර වදාරණ සේක් භික්ෂු සංඝයා මධ්‍යයෙහි ප්‍රඥප්තවර බුද්ධාසනාරූඪව වැඩහිඳ ධර්ම දේශනා කරනාහු අංගශී ධර්ම ප්‍රතිවේධ ලත් භික්ෂූන් අතුරෙන් මා පුත් අඤ්ඤාකොණ්ඩඤ්ඤ ස්ථවිර තෙම අග්‍රයයි තනතුරු දී වදාළසේක. අඤ්ඤාකොණ්ඩඤ්ඤ ස්ථවිරයන් වහන්සේද තමහට යවත් පැවතුම් ඇති දෙයගෑවිවත් දැක බුදුන් හමුවෙන් නික්මයනු කැමතිව "ද්‍රෝණවස්තු" නම් බමුණු ගමට ගොස් තමන්වහන්සේගේ බෑනණුවූ "පුණ්ණ" නම් බ්‍රාහ්මණ මානවකයා ගෙණ පැවිදිකරවා බුදුන් සමීපයෙහි වාසය කෙරෙන්වායි සර්වඥයන් වහන්සේගේ සමීපාවචර භාවය ඔහට පවරා තමන් වහන්සේ බුදුන් කරා එළඹ "ස්වාමීණි මට ග්‍රාමාන්ත සේනාසන නො සැපවත් නේය. ආකීර්ණව විසිය නොහැක ඡද්දන්ත විල් තෙර වාසය කරන්නෙමැයි" භාග්‍යවත් බුද්ධරජානන් වහන්සේ අනුදන්වා අවසර ලැගෙණ ශාස්තෘන් වහන්සේ සතසා වැද ඡද්දන්ත විල් තෙරට වැඩමකොට ඡද්දන්ත හස්ති සමූහයා නිසා දොළොස් අවුරුද් දක් කල් එහි වැස එතැන්හිම අනුපාදිශේෂ නිර්වාණ ධාතුවෙන් පිරිණිවන් පා වදාළසේකි.

අඤ්ඤාකොණ්ඩඤ්ඤ සූත්‍ර සවිස්තර භාව සමාප්ත.

නිමි.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු